# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 70 — 1973 ජූලි 27 වැනි සිකුරාදා — 1973.07.27

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# I වැනි කොටස: (II අ) වැනි ඡේදය — පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු .. .. .. | 917 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය | 932 |


සැළකිය යුතුයි.— ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 26 දරන ශ්‍රී ලංකා නැව් ඉඩ පහසුකම් වෙන් කිරීමේ මධ්‍ය කාර්යාංශ පනත ; ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 27 දරන කෘෂිකර්ම රක්ෂණ පනත 1973 ජූලි 27 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයන් වශයෙන් පළවේ.

# තනතුරු — ඇබෑර්තු

## ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළකරවනු ලබන රාජ්‍ය සේවා පත්කිරීම් වලට අදාළ වන පොදු කොන්දේසි

### 1. අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම්

1 : 1 තමා ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම් කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

"ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම ලැබුවෙකි.

1 : 2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම් කරුවකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙක් වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල භාෂාව විෂයයෙන් සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත්, රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

1 : 3 නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් අසමත්වීම හේතු කොට ගෙන පරිවාස/පරීක්ෂණ කාලය සහිත සේවය අවසන් කරනු ලැබූ "නව ප්‍රවේශක" රජයේ නිලධාරීන් ව සිටි අය, අංක 640 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව අදළ තනතුරට හෝ සේවයට නියමිත වූ ඉහළම සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් වීමට හිමිකම් ලබන අන්දමේ සුදුසුකම් ලබා ගෙන සිටිතොත් මිස, එසේ නොමැති නම්, ඔවුන් ගෙන් ලැබෙන අයදුම් පත් භාරගනු නො ලැබේ.

### 2. දීමනා

2 : 1 ඒ ඒ තනතුරට අදාළ මාසික ඒකාබද්ධ වැටුපට අතිරේක වශයෙන්, රාජ්‍ය සේවයෙහි නියුක්ත මාසික වැටුප් ලබන සියලුම විවාහක නිලධාරීන්ට ආයතන සංග්‍රහයේ, VIII වැනි පරිච්ඡේදයෙහි 1 වැනි වගන්තියෙහි දක්වා ඇති පදනම මත විවාහක දීමනාවක් ගෙවනු ඇත.

2 : 2 (සියලුම දීමනාවන් ද ඇතුලුව) රු. 180 සිට රු. 250 දක්වා මාසික වැටුප්/වේතන ලබන ගණයට අයත් රාජ්‍ය නිලධාරීන්ට මාසික වශයෙන් රු. 7.50 ක විශේෂ දීමනාවක් ගෙවනු ඇත. අවශ්‍ය තැන මෙම දීමනාව ක්‍රමික කිරීමට ඉඩ ඇත.

### 3. සේවා කොන්දේසි : සාමාන්‍ය

3 : 1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි, වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තාහ.

3 : 2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලෙස රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥා පනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

3 : 3 දිවයිනෙහි ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැක.

**4. ස්ථිර පත්වීම් දරණ රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

4 : 1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 3 වැනි වගන්තියෙහි සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුත්තාහ :—

4 : 1 : 1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතුයැයි සලකනු ලබන්නේ නම් විනා, එසේ නොමැති නම්, සියලුම පත් කිරීම් අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ, හේතුවක් නොදක්වා සේවය කෙළවර කරනු ලැබිය හැකිය.

4 : 1 : 2 රාජ්‍ය සේවයෙහි "නව ප්‍රවේශකයන්" වන සියලුම රාජ්‍ය නිලධාරීහු, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවන් සඳහා, 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතෙහි විධි විධානවලටත්, රාජ්‍යයෙහි භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට ක්‍රියාත්මකව පවත්නාවූත්, අනාගතයේදී පනවනු ලැබිය හැකි වූත් නීති සහ ව්‍යවස්ථා වෙතොත්, ඒවාටත් අනුකූල විය යුත්තාහ.

4 : 1 : 3 රාජ්‍ය භාෂාවෙන් වැඩ කිරීමට හැකි වන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබා ගන්නා ලෙස සියලුම රාජ්‍ය නිලධාරීන්ට නියම කෙරේ.

4 : 1 : 4 පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත් වීමත්, අවුරුදු දෙකක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි II වැනි ශ්‍රේණියෙන් සමත් වීමත් (අවශ්‍ය නම්), අවුරුදු තුනක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි III වැනි ශ්‍රේණියෙන් සමත් වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාලසීමාව ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයන් තාවකාලිකව අත්හිටවනු ලැබිය හැකිය. නියමිත කාල සීමාව ඉක්මී තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත් වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත් හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත් වන තෙක් හෝ පහත දැක්වෙන 4 : 1 : 5 වැනි වගන්තියෙහි විධි විධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

4 : 1 : 5 පරිවාස කාල සීමාව අවසානයේදී සිංහල ප්‍රවීනතාවය පිළිබඳ නියමිත තත්ත්වයට පැමිණීමට නොහැකි වුවහොත්, එහි ලා ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයෙහි 12 : 13 වැනි වගන්තියෙහි විධි විධානයන් ක්‍රියාත්මක වනු ඇත.

4 : 1 : 6 සිංහල මාධ්‍යයෙන් සේවයට බඳවා ගනු ලැබ අය විෂයෙහි 4 : 1 : 3, 4 : 1 : 4, සහ 4 : 1 : 5 වැනි වගන්ති අදාළ නොවන්නේය.

4 : 1 : 7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාල සීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැක.

4 : 1 : 8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද, වෛද්‍ය පරීක්ෂණයට භාජන කරනු ලැබුවා වූද අය හැර) තෝරා ගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනෙහි ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත් වන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

**5. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

5 : 1 1972. 01. 01 වැනි දිනට පසු, ස්ථිර සේවයට අයත් තනතුරුවලට හෝ තාවකාලික සේවයට අයත් මාසික වැටුප් සහිත තනතුරුවලට හෝ (දෛනික වැටුප් රේට් ප්‍රමාණයන් ගෙවනු ලබන—සේවකයන් හැරයි) පත් කරනු ලබන සියලුම රාජ්‍ය නිලධාරීන් විසින් තමන්ගේ ඒකාබද්ධ වැටුපෙන් 6% ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී ගෙවා ඇති ඒකාබද්ධ වැටුපෙන් සියයට 9%ක් රජය විසින් එම අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවනු ඇත. එබඳු තනතුරක් දරන්නකුට (කැමති නම්) තමාගේ මනාපය පරිදි තම මාසික ඒකාබද්ධ වැටුපෙන් තව 6% ක් දක්වා වූ සෙච්ඡා දායක මුදලක් එම අරමුදලට ගෙවිය හැක. එහෙත් එම දායක මුදල වෙනුවෙන් රජය විසින් දායක මුදලක් නොගෙවනු ඇත.

5 : 2 1971. 12. 31 වැනි දිනට පෙර රාජ්‍ය සේවයෙහි ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරු දරමින් සිටි රාජ්‍ය නිලධාරීන්, 1972. 01. 01 වැනි දිනට පසු. රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරකට පත් කරනු ලැබුවහොත්, එම තනතුර දරන නිලධාරියාට පමණක් පෞද්ගලික වූවක් වශයෙන් යථෝක්ත විශ්‍රාම වැටුප් හිමිකම නොකඩවා භුක්ති විඳීමට ඉඩදෙනු ඇත. එම රාජ්‍ය නිලධාරියා පෙර පරිදිම වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු වනු ඇත.

**6. යුද්ධ සේවා අනුග්‍රහය**

6 : 1 එක්සත් රාජ්‍යයේ යුද්ධාවතීර්ණ හමුදාවන්හි සේවා මුක්ත භටයන්ටද සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජනාරක්ෂක සේවාවන්හි පූර්ණ කාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිට තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්වී නොගිය අයට ද ඉහත කී සියලුම සුදුසුකම් තිබේනම්ද, ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතු නම්ද ඔවුන්ගේ එම සේවය සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස් වලින්, 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තමතමන් සේවය කළ කාලයන් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**7. රජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

7 : 1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලුම සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නාවූද රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරට තෝරාගනු ලැබුව හොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකිද නොහැකිද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

7 : 2 නියමිත වේලාවක නියමිත ස්ථානයකදී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

7 : 3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව අයථා අනුග්‍රහයක් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සෙකු කරනු ලැබීමට හේතු වනු ඇත.

7 : 4 අයදුම්කරුවකුගේ අයදුම් පතෙහි යම්කිසි සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

7 : 5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

**8. සුදුසුකම පිළිබඳ අවශ්‍යතාව සඳහා වැටුප යන්නෙහි අර්ථ දැක්වීම**

8 : 1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

---

යොමු අංකය : සය/20/243

අධ්‍යාපන අමාත්‍යාංශය

ගුරු විද්‍යාලයන්හි ගොවිපල කළමනාකරු තනතුරු

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති ගුරු විද්‍යාලයන්හි ගොවිපල කළමනාකරු තනතුරු සඳහා පහත දක්වෙන සුදුසුකම් ඇති පිරිමි ආපේක්ෂකයින්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍ර 1973.08.10 වැනි දින හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ (සාමාන්‍ය පරිපාලන ශාඛාවේ) ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුයි.

**2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—(i) තනතුරු ස්ථිරය. පත්වීම අර්ථසාධක අරමුදල් ක්‍රමය යටතේවනු ඇත. පත්කරනු ලබන අය විසින් තම වැටුපෙන් 6% ක් අර්ථ සාධක අරමුදල් සඳහා දායක මුදල් වශයෙන් ගෙවිය යුතු අතර, රජය 9% ක් ඒ සඳහා ගෙවනු ඇත.

(ii) පත් කරනු ලබන්නා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ අවශ්‍යතාවන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයෙකු වන්නේ නම්, පරීක්ෂා කාල සීමාව අවුරුදු 3 ක් වන්නේය.

(iii) රජයේ සේවයේ ස්ථිර තනතුරක් දරන්නෙකු තෝරාගනු ලැබුවහොත් පත්වීම නියමිත කාලයකට වැඩ බැලීමේ පදනමක් මත වේ.

(iv) පත් කරනු ලබන්නා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුය.

(v) බඳවා ගනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයක් සහ ප්‍රායෝගික පරීක්ෂණයක් මගිනි.

**3. වැටුප් හා දීමනා.**—රු. 3,864 කින් ආරම්භ වී රු. 144 වාර්ෂික වැඩිවීම් 19 ක් හා රු. 180 වැඩිවීම් 4 ක් මගින් රු. 7,320 දක්වා නගින ඒකාබද්ධ වාර්ෂික වැටුප් ක්‍රමයක් මෙම තනතුරට අයත්ය.

**සටහන.**—තෝරා පත්කර ගන්නා අයට දෙපාර්තමේන්තු පරීක්ෂණයෙන් සමත් නොවී රු. 4,008 ක වැටුප් ඉක්මවා යා නොහැකි අතර, ස්වකීය සේවය ස්ථිර කරන තෙක් මෙම අපේක්ෂකයින්ට රු. 4,150 වාර්ෂික වැටුප ද ඉක්මවා යා නොහැකිය.

**4. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.**—(i) ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට අවුරුදු 25 කට නො අඩු හා 40 ට නොවැඩි විය යුතුයි.

(දැනටමත් රජයේ සේවයේ ස්ථිර තනතුරු දරණ අයහට උපරිම වයස් සීමාව බලපානු නො ලැබේ.)

(ii) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත විය යුතුය.

(iii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ දෙකකට නොවැඩි වාර ගණනකින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී අංක ගණිතය/ගණිතය හා සිංහල භාෂාව/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 6 කින් සාමාර්ථය හෝ ඊට සමාන හෝ උසස් සුදුසුකම් ලබා සිටිය යුතුය.

(iv) පේරාදෙණිය හෝ කුණ්ඩසාලේ කෘෂිකර්ම පුහුණුව හෝ හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයේ දෑවුරුදු කෘෂකර්ම පුහුණුව ලබා සිටිය යුතුය.

(v) අවුරුදු 5 කට නො අඩු කාලයක් ගොවිපලක් භාරව කටයුතු කිරීමේ පළපුරුද්දක් සහ කෘෂිකර්ම පාසැලක ඉගැන්වීමේ පළපුරුද්දක් ලබා තිබීම.

**සටහන.**—සිංහල/දෙමළ භාෂාවෙන් වැඩ කිරීමේ මනා දැනීමක් තිබිය යුතුය. නමුත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් හා අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඕනෑම කෙනෙකුට (යම්කිසි කාලයක් ඇතුළත දී නියම කරනු ලබන මට්ටමකින්) සිංහල ප්‍රවීණතාවයක් ලබා ගැනීමට නියම කළ හැකිය.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍යවූ විටක ඉදිරිපත් කිරීමට සෑම අයදුම්කරුවෙකුම සූදනම් විය යුතුය :—

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ අධ්‍යයන පොදු සහතිකය ;
(ආ) 4 ඡෙදයේ සඳහන් සහතික පත්‍ර ;
(ඇ) සිංහලෙන් සමත්වී ඇති ඉහළම විභාගය දක්වෙන සහතිකය ;
(ඈ) උප්පැන්න සහතිකය.

සටහන.—(i) ලියකියවිලිවලත්,ලියකියවිලිවල පිටපත්වත් අයදුම්පතට අමුණා නො එවිය යුතුය.

(ii) ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ විට ඒවා ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ගැන සළකා බලනු නො ලැබේ.

6. අයදුම්කරුවන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත් ස්වකීය දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානින් මගින් ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනට ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම් පත් ප්‍රතික්ක්ෂප කරනු ලැබේ. එහෙත් නියම අවස්ථාවේදී දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාට ලැබී ප්‍රමාදය සඳහා සැළකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් එසේ ප්‍රමා වී ලැබෙන ඉල්ලුම් පත් බාර ගනු ලැබේ.

7. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (IIඅ) ඡෙදයේ ආරම්භයේ දක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත්වීම් සම්බන්ධ පොදු කොන්දේසි ද බලනු මැනවි.

8. ඉල්ලුම් පත් ලැබුන බව දන්වනු ලැබේ. ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනය පසු වී දින 21 ක් ඇතුළත ඉල්ලුම් පත ලැබුණ බවට ලිපියක් නො ලදහොත් වහාම ඒ බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවකු මේ අවශ්‍යතාවය පැහැර හරින්නේ නම් තම අයදුම් පත්‍රය සළකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජූලි මස 27 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ,
සාමාන්‍ය පරිපාලන ශාඛාවේදීය.

ආදර්ශ ඉල්ලුම් පත්‍රය

(අඟල් $8\frac{1}{2} \times 13\frac{1}{2}$ ප්‍රමාණයේ කඩදාසිවල සකස් කළ යුතුය)

අධ්‍යාපන අමාත්‍යාංශයේ ගුරු විද්‍යාලයන්හි ගොවිපළ කළමනාකරු තනතුරු

1. නම (මුලකුරු සහිතව) : ————. මහතා
2. සම්පූර්ණ නම : ————.
3. රාජකාරි ලිපිනය : ————.
4. පෞද්ගලික ලිපිනය : ————
5. (අ) ලාංකිකයෙක් ද යන වග : ————.
(ආ) එසේ නම්, පරම්පරාවෙන්ද, ලියාපදිංචි වීමෙන්ද ? : ————
6. උපන් දිනය : —— අවුරුද්ද : ————, මාසය : ————, දිනය : ————.
7. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස : —
අවුරුදු : ————, මාස : ————, දින : ————,

**3. සුදුසුකම්.**—අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුයි.

(i) ලංකාවේ පුරවැසියන් විය යුතුයි.

(ii) 1974. 4. 1 වැනි දිනට, වයස අවුරුදු 35 ට අඩුවිය යුතුයි. (එනම් 1939. 4. 2 වැනි දින හෝ එදිනට පසු උපන් අය විය යුතුයි.)

(iii) යටත් පිරිසෙයින් හැදෑරීමට අදහස් කරන පශ්චාත් උපාධි පාඨමාලාවට උචිත වන සේ (පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත්) උපාධියක් තිබිය යුතුය. (ප්‍රතිඵල අපේක්‍ෂාවෙන් අයදුම්පත් භාරගනු නොලැබේ.)

(iv) ජපන් භාෂාව ඉගෙනීමට කැමති විය යුතුය. (ඉගැන්වීමේ මාධ්‍යය ජපන් භාෂාව වන හෙයිනි.)

**සංලක්‍ෂය 1.**—ශ්‍රී ලංකා ජන රජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ලයක, විශ්ව විද්‍යාලයක හෝ ශ්‍රී ලංකා ජන රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුවකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපේක්‍ෂකයන්, ඒ කාල සීමාවේ සේවය සම්පූර්ණ කොට 1974. 4. 1 දින වන විට ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත්නම් මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය.

**සංලක්‍ෂය. 2.**—එසේම, තාවකාලික තනතුරු දරණ හෝ ස්ථිර තනතුරු දරන නමුත් තනතුරේ ස්ථිර කරනු නොලැබූ රජයේ සේවකයන් ද, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් ඉල්ලා අස්වීමට කැමැති නම් මිස, අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය. එසේ අස් වීමට කැමති නම් ඒ බව අයදුම්පතේ 15 (ඊ) කොටුවේ නිශ්චිත වශයෙන් සඳහන් කළ යුතුය.

4. **ප්‍රධානයට අයත් ප්‍රතිලාභයන්.**—ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත් ය :—

(අ) ලංකාවේ සිට ජපානයට යාම් සහ ආපසු පැමිණීම සඳහා සංචාරක පන්තියේ ගුවන් ගමන් පහසුකම්.

(ආ) මසකට යෙන් 79,500 බැගින් යැපීම් දීමනාවක්.

(ඉ) ජපානයට ගොඩබැසීමේදී අවශ්‍ය හදිසි වියදම් සඳහා වර්ෂය කට යෙන් 25,000 ක පමණ දීමනාවක්.

(ඊ) ඉගෙනීම පිළිබඳ ජපානය ඇතුළත ගමන් වියදම් සඳහා කට යෙන් 35,000 ක පමණ දීමනාවක්.

(උ) ඉගැන්වීමේ ගාස්තු, විභාග ගාස්තු ආදියෙන් නිදහස් කිරීම.

(ඌ) නේවාසික පහසුකම්.

**සංලක්‍ෂය.**—මේ ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන රජයේ සේවක යන්ට නිවාඩු දීම, අවස්ථාවට වලංගුව පවත්නා භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු නීතිරීතින්ට යටත් වන්නේ ය.

**5. සම්මුඛ පරීක්‍ෂණය.**—සුදුසුකම් ලත් අයදුම්කරුවන්, නියමිත ස්ථානයක හා වේලාවක කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්‍ෂණය කට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්‍ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්‍ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලි වල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතුය.

6. **ගිවිසුම.**—තෝරාගනු ලබන අපේක්‍ෂකයන් ජපානය බලා පිටත්ව යාමට පෙර—

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදාරා සතුටුදායක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය වුව හොත්, ශ්‍රී ලංකා ජන රජය විසින් නියම කරනු ලබන යම් කිසි කාලසීමාවක් තුළ ශ්‍රී ලංකා ජන රජය යටතේ සේවය කිරීමට ද.

(ආ) තමාගේ ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජන රජයට හා ප්‍රධාන අධිකාරීන්ට දරන්නට සිදුවූ සියළුම වියදම් හා රජයේ සේවක යෙක් නම්, ඊට අමතරව වේතනය, දීමනා ආදිය ඇතුළු වියදම්) ශ්‍රී ලංකා ජන රජයට ආපසු ගෙවීමට ද, පොරොන්දු වන ගිවිසුමකට අත්සන් කළ යුතුය.

7. **වෛද්‍ය පරීක්‍ෂණය.**—තෝරාගනු ලබන අපේක්‍ෂකයන් ජපානයේ අධ්‍යයන පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට ද ශ්‍රී ලංකා ජන රජය විසින් පත් කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මගින් පැවැත්වෙන වෛද්‍ය පරීක්‍ෂණයකින් සමත් විය යුතුය.

8. රජයේ සේවකයන් සම්බන්ධයෙන්, බලාපොරොත්තු වන පුහුණුව ඔවුන් විසින් දැනට දරන තනතුරෙහි වැඩි වේතනයක් හෝ උසස්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන්නේ ය. සෙසු අය සම්බන්ධ යෙන් ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු රක්‍ෂා ලබාදීමට ශ්‍රී ලංකා ජන රජය පොරොන්දු නොවන්නේ ය.

9. මෙම ඉල්ලුම්පත්‍රයෙහි යම්කිසි වැරදි ප්‍රකාශයක් කර ඇති බව තෝරාගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එයින් නුසුදුසු බවට පත්වේ. තෝරා ගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

10. තෝරාගනු ලැබූ අපේක්‍ෂකයකු තෝරාගැනීමෙන් පසු නාම යෝජනා කරනු ලැබීම හෝ නාමයෝජනා කිරීමෙන් පසු ප්‍රදානයන් පිළිගැනීම හෝ ප්‍රතික්‍ෂෙප කළහොත්, අවුරුදු දෙකක කාල පරිච්ඡෙද යක් ගතවන තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා හෝ ඔහු සලකා බලනු නොලැබේ.

11. කිසියම් අපේක්ෂකයකු ශ්‍රී ලංකා අධිකාරීන් විසින් නාම යෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතුය. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, සම්පූර්ණයෙන්ම, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රදාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදුවන්නක් හෙයිනි.

12. යම් අපේක්‍ෂකයකු තෝරාගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබාගැනීමට හෝ බලපෑවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම එම අපේක්‍ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

13. මේ නිවේදනයේ හා අයදුම්පත් ආකෘතියේ සඳහන් අවශ්‍යතාවන් සියල්ල සෑම ආකාරයෙන් සම්පූර්ණ නොකෙරෙන අයදුම් පත් ප්‍රතික්‍ෂෙප කරනු ලබන්නේ ය.

14. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශේෂ ආකෘතියක පිළියෙල කළ යුතු අයදුම්පත්, 1973. 8. 10 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් භාරගනු නො ලැබේ.

15. සෑම අයදුම්පතක් සම්බන්ධයෙන්ම රුපියල් 10ක මුද්දර ගාස්තුවක් ගෙවිය යුතු වන්නේ ය. අයදුම්පත් ආකෘතියේ මුල් පිටුවේ ඒ සඳහා වෙන්කොට ඇති කොටුවේ රුපියල් 10 ක මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන යෙදීමෙන් අවලංගු කළ යුතුය.

16. රජයේ සේවකයින් විසින් එවන අයදුම්පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින් විසින් එවන අයදුම්පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මගින් ද එවිය යුතුයි. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම් වුවද, මේ අවශ්‍යතාව සපුරාලිය යුතුය. අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සේවය කරන නිලධාරීන් අදාල අධ්‍යාපන අධ්‍යක්‍ෂවරුන් මාර්ගයෙන් තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

17. සියළුම අයදුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම් පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7 ක් ඇතුළත අයදුම් පත් ලැබුණු බවට දන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම්කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේ ය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජූලි මස 17 වැනි දා,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

7–965—73. 07. 27 දින අංක 70 දරන ගැසට් පත්‍රය

---

අධ්‍යාපන අමාත්‍යාංශය—ශ්‍රව්‍ය දෘෂ්‍ය සහකාර තනතුරු.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ශ්‍රව්‍ය දෘෂ්‍ය සහකාර තනතුරු සඳහා පහත දැක්වෙන සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව පිළියෙළ කරන ලද ඉල්ලුම්පත් 1973 අගෝස්තු මස 21 වැනි දින හෝ ඊට ප්‍රථම කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ (සාමාන්‍ය පරිපාලන ශාඛාවේ) ලේකම්ට ලැබෙන සේ එවිය යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :**

(i) තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පත් කරනු ලබන්නන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ අවශ්‍යතාවයන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයන් නම් අඩු තික කාලසීමාව අවුරුදු 3 ක් වන්නේ ය.

(iii) රජයේ සේවයේ ස්ථිර තනතුරක ස්ථිර කරනු ලැබ සිටින නිලධාරියකු තෝරා ගනු ලැබුවහොත් ඔහුගේ පත්වීම නියමිත කාලයක් වැඩ බැලීමේ පදනම මතය.

(iv) පත් කරනු ලබන්නන් තමාට නියම කරනු ලබන දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුයි.

(v) බඳවා ගනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

3. **වැටුප් හා දීමනා.**—මෙම තනතුරට අයත් ඒකාබද්ධ වාර්ෂික වැටුප් ක්‍රමය, රු. 3,864—18×144—රු. 6,456 වේ. (1969. 10. 01 දිනට පූර්ව මීට අනුරූප වැටුප් ක්‍රමය රු. 1,620—18×120—රු. 3,780 වේ.)

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් කරුණු සනාථ කිරීම සඳහා සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට යටත් පිරිසෙයින් අවුරුදු 21 ට නො අඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුයි. (දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නන්ට උපරිම වයස් සීමාව බලපානු නො ලැබේ.)

(ii) (අ) ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන්ගෙන් දෙකකින් සාමාර්ථය ඇතිව, ඕනෑම විෂයයන් දෙකකින් සම්මාන සාමාර්ථ දෙකක් සහිත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය, හෝ

(ආ) දෙවරකට නොවැඩි වාර ගණනක දී භාෂාව, (සිංහල හෝ දෙමළ) ඇතුළුව ගණිතය, භෞතික විද්‍යාව හෝ රසායන විද්‍යාව යන විෂයයන්ගෙන් දෙකක් සහිතව ඕනෑම විෂයයන් දෙකකින් සම්මාන සාමාර්ථයන් සමඟ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් (6) සමත් වී තිබීම.

(ඇ) ඉහත (අ) සහ (ආ) ඡේදයේ සුදුසුකම්වලට සමාන හෝ ඊට වඩා උසස් සුදුසුකම් ලබා තිබීම.

(iii) පහත සඳහන් ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ක්‍රියාත්මක කිරීමේ මූලධර්ම හා උපකරණ නඩත්තු කිරීම හා අළුත්වැඩියා කිරීම පිළිබඳව මනා දැනීමක් තිබිය යුතු අතර, එම යන්ත්‍ර උපකරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳව මනා දැනීමක් තිබිය යුතුය :—

මිලි මීටර් 35 ප්‍රක්ෂේපනය
කදා ප්‍රක්ෂේපකය
එපිඩස් කෝපය
තැටි වාදනය කිරීමේ යන්ත්‍රය
පටිගත කිරීමේ යන්ත්‍රය
මිලි මීටර් 16 චිත්‍රපට හා ශබ්ද ප්‍රක්ෂේපකය.

(iv) චිත්‍රපටි පුස්තකාල වැඩ ගැන මනා දැනීමක් තිබිය යුතුය.

(v) ඉහත iii සහ(iv) සඳහන් වැඩ සම්බන්ධ අවුරුදු පහක පළපුරුද්දක් තිබිය යුතුය.

(vi) ඡායාරූප ශිල්පය පිළිබඳ පළපුරුද්දක් තිබිය යුතුය.

**සටහන.**—අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ සිනමා යන්ත්‍ර ක්‍රියාකරු සහ සහකාර සිනමා යන්ත්‍ර ක්‍රියාකරු වශයෙන් අවුරුදු දහයකට නො අඩු සේවයක් ඇත්තා වූද, ඉහත සඳහන් (iii) සිට (iv) දක්වා වූ සුදුසුකම් ඇත්තා වූ ද, සේවකයින් ඉහත (2) සඳහන් අධ්‍යාපනික සුදුසුකම් නො තකා සලකා බලනු ලැබේ.

(vii) විශිෂ්ඨ චරිතයකින් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත විය යුතුය.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය වූ විටෙක ඉදිරිපත් කිරීමට සෑම අයදුම් කරුවෙකුම සූදානම් විය යුතුය :—

(අ) ලැබූ ඉහළම අධ්‍යාපන සහතිකය.

(ආ) ලබා ඇති වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) ශ්‍රව්‍ය දෘශ්‍ය හා චිත්‍රපටි පුස්තකාල වැඩ ගැන පළපුරුද්ද ඔප්පු කිරීමේ සහතික.

**සටහන.**—

(i) ලියකියවිලිවත්, ලියවිලිවල පිටපත්වත් අයදුම්පතට අමුණා නොඑවිය යුතුයි.

(ii) ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ විට ඒවා ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

6. රජයේ සේවයේ නියුක්ත සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත් ස්වකීය දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත් තම ඉල්ලුම්පත්‍රයේ පිටපතක් කෙලින්ම අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ නමට ද එවිය යුතුයි. නියමිත දිනට ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එහෙත්, නියම අවස්ථාවේ දී දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාට ලැබී ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණයක් ඉදිරිපත් කළ හොත් පමණක් එසේ ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම් පත් භාර ගනු ලැබේ.

7. ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) ඡේදයේ ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවා තනතුරු වලට කරනු ලබන පත්වීම් සම්බන්ධ පොදු කොන්දේසි ද බලනු මැනවි.

8. ඉල්ලුම්පත් ලැබුණු බව දන්වනු ලැබේ. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනය පසු වී දින 14 ක් ඇතුලත ඉල්ලුම්පත ලැබුණු බවට ලිපියක් නොලද හොත් වහාම ඒ බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවකු මේ අවශ්‍යතාවය පැහැර හරින්නේ නම් තම අයදුම්පත්‍රය සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජූලි මස 17 දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

(මෙම ඉල්ලුම් පත්‍රය අඟල් $8\frac{1}{2} \times 13\frac{1}{2}$ ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කළ යුතුයි.)

**අධ්‍යාපන අමාත්‍යාංශය—ශ්‍රව්‍ය දෘශ්‍ය සහකාර තනතුරු**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ස්ථිර ලිපිනය :————.

3. ගම් ප්‍රදේශය :————.

4. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට නියම වයස :—
අවු :————, මාස :————, දින :————.
උපන් දිනය :————.

5. උපන් ස්ථානය :—

(අ) ඉල්ලුම්කරු :————.

(ආ) ඉල්ලුම්කරුගේ පියා :————.

(ඇ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) ඉල්ලුම්කරුගේ පියාගේ පියාගේත් පියා :————.

6. ලාංකිකත්වය පරම්පරාවෙන් ද, ලියාපදිංචි කිරීමෙන්ද යනවග :————.

7. අධ්‍යාපන සුදුසුකම් :—

(i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය/අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී සමත් විෂයයන් හා වර්ෂය පිළිබඳ විස්තර (සම්මාන හා විශිෂ්ඨ සාමාර්ථයන් ආදිය සඳහන් කළ යුතුයි) :————.

(ii) ශ්‍රව්‍ය දෘශ්‍ය හා චිත්‍රපටි පුස්තකාල වැඩ ගැන පළපුරුද්ද ඔප්පු කිරීමේ සහතිකවල විස්තර :————.

(iii) සිංහලෙන්/දෙමළෙන් සමත් වී ඇති උසස් ම විභාගයේ විස්තර :————.

8. නිවේදනයේ 5 වැනි ඡේදයේ (ඇ) යටතේ සේවා විස්තර; (සේවය කළ ආයතන, සේවා කාලයත්, දැරූ තනතුර සඳහන් කළ යුතුයි) :————.

9. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

10. කිසියම් අපරාධ වරදක් නිසා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේ නම් (අ) දිනය, (ආ) නඩු නොම්මරය, (ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

11. මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නොවේ නම්, ඔබේ ණය තුරුස්වල ප්‍රමාණය කොපමණද ?

12. ඔබට විරුද්ධව විනයානුකූලව කටයුතු කර තිබේද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

13. සේවා මුක්ත භටයෙක් වී නම් (අ) සේනාංකය, (ආ) නිලය, (ඇ) සේවයට බැඳුණු හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

14. පාඨශාලාවෙන් අස්වූ දින සිට යෙදී සිටි රැකීරක්ෂා :—

(i) දරන ලද තනතුර :————.

(ii) නියුක්තව සිටි වකවානුව :————.

(iii) අස්වීමට හේතුව :————.

15. ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයක් යටතේ හෝ කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිට, එහි සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම් :————.

(අ) එම රක්ෂාව පිළිබඳ විස්තර :————.

(ආ) සේවයේ යෙදී සිටි කාලය :————.

(ඇ) සේවය නතර කිරීමට හේතු :————.

16. දැනට යෙදී සිටින රක්ෂාව :————.

(i) ආයතනය :————.

(ii) තනතුර හා ශ්‍රේණිය :————.

(iii) ඊට පත්වූ දිනය :————.

(iv) විශ්‍රාම වැටුප් සහිත ද ? තාවකාලික හෝ අනියම් ද ? :————.

(v) දීමනා රහිතව දැනට ලැබෙන වැටුප හා වැටුප් ක්‍රමය :————

(vi) මීළඟ වැටුප් වැඩිවීමේ දිනය :————.

17. වෙනත් කරුණු :————.

18. මේ අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයාගනු ලැබුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුව හොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන,

දිනය :————.

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය.

මගේ අංකය :
ඔබේ අංකය : සාප/30.

අධ්‍යා/ලේ.,

මෙම අයදුම්පත මෙම කාර්යාලයට ලැබී ඇත්තේ අයදුම්පත් බාර ගන්නා අවසාන දිනට පසුය/පෙරය.*

ඉල්ලුම් පත්‍රයේ සඳහන්..............................අංකිත ඡේදවල විස්තර නිවැරදි බැව්/පහත සඳහන් සංශෝධනයන්ට යටත් බැව්* මෙයින් සහතික කොට ඉදිරිපත් කරමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන,

පදවි නාමය :————.

දිනය :————.

(*අදාළ නැති කොටස් කපා හරින්න)

7–1006—73. 07. 27 දින අංක 70 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන අමාත්‍යාංශය

### රජයේ කලා හා කලාශිල්ප විද්‍යාලයේ ආදර්ශ රූප (MODELS) මෙන් පෙනී සිටීමට සේවකයින් බඳවා ගැනීම

රජයේ කලා හා කලාශිල්ප විද්‍යාලයේ චිත්‍ර හා මූර්ති පාඨමාලා සඳහා ආදර්ශ රූප (MODELS) වශයෙන් පෙනී සිටීමට කැමති ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන් ඒ සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව සකස් කර ගන්නා ලද අයදුම්පත් 1973 අගෝස්තු 15 දින හෝ ඊට පෙර, කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ රජයේ කලා හා කලාශිල්ප විද්‍යාලයේ විදුහල්පති වෙත ඉදිරිපත් කළ යුතුය.

2. **ගෙවීම්.**—ආදර්ශ රූප වශයෙන් පෙනී සිටින පිරිමියකුට දිනකට රුපියල් 5 ක් ද ගැහැණු අයකුට දිනකට රු. 7.50 ක් ද ගෙවනු ලැබේ.

3. **සේවා කොන්දේසි.**—මෙම පත්වීම හුදෙක් අනියම් පදනමක් මත කෙරෙන ඒවායි. සේවයේ දීර්ඝ බව නිසා හෝ වෙනත් කිසිම හේතුවක් නිසා හෝ ස්ථිර කරනු ලැබීමට තුඩු දිය හැකි ඒවා නොවේ.

4. මෙම පත්වීම් ලබන්නන්ගේ සේවය අනවශ්‍යයැයි හැඟී යන ඕනෑම වේලාවක රජයේ කලා හා කලාශිල්ප විද්‍යාලයේ විදුහල්පති විසින් සේවය නවතා දමනු ලැබීමට මෙම පත්වීම ලබන්නෝ යටත් වෙති.

5. මෙම පත්වීම ලබන්නන් සතියේ දිනවල පෙ. ව. 8.30 සිට ප. ව. 3.30 දක්වාත් සෙනසුරාදා දිනවල පෙ. ව. 8.30 සිට ප. ව. 2 දක්වාත් සේවයෙහි යෙදිය යුතුය.

6. තෝරාගනු ලබන අයදුම්කරුවන් රජයේ කලා හා කලාශිල්ප විද්‍යාලයේ විදුහල්පති විසින් දෙනු ලබන කාල සටහන්වලට අනුව නියමිත වේලාවට සේවය සඳහා පැමිණිය යුතුය. කලින් දැන්වීමක් නොකර සේවය සඳහා නොපැමිණෙන අය සේවය අතහැර ගියවුන් ලෙස සලකනු ලැබේ.

7. **සුදුසුකම්.**—මෙම පත්වීම සඳහා අයදුම්කරන්නන්ගෙන් අධ්‍යාපන සුදුසුකම් අපේක්ෂා නොකෙරේ. එහෙත් ඔව්හු යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුත්තාහ.

8. **තෝරා ගැනීම.**—මේ පත්වීම් සඳහා සුදුස්සන් තෝරා ගනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයකින් පසුවය. එසේ තෝරාගත් පසු ඔවුන් සේවයට පැමිණිය යුතු දින හා කාල සටහන් ආදිය ගැන රජයේ කලා හා කලාශිල්ප විද්‍යාලයේ විදුහල්පති විසින් ඔවුන්ට දැනුම් දෙනු ඇත.

ඒ. ජේ. එස්. ගුණවර්ධන,
කොළඹ ප්‍රදේශයේ අධ්‍යාපනාධ්‍යක්ෂ.

1973 ජූලි මස 18 වන දින,
කොළඹ 7, ග්‍රීන්පාත් හි
ප්‍රාදේශිය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

### අයදුම් පත්‍රය

#### රජයේ කලා හා කලාශිල්ප විද්‍යාලයේ ආදර්ශ රූප (MODELS) මෙන් පෙනී සිටීමට සේවකයින් බඳවා ගැනීම

1. නම :————.
2. ලිපිනය :————.
3. ස්ත්‍රී පුරුෂ භාවය :————.
4. වයස (1973 අගෝස්තු 15 දිනට) :—
   අවුරුදු :——, මාස :——, දින :————.
5. උස :————.
6. අධ්‍යාපන සුදුසුකම් :————.
7. මීට කලින් මෙවැනි සේවයක යෙදී පළපුරුද්දක් ඇත්තේද යන වග :————.
8. ඔබ යම්කිසි වරදකට වරදකරුවී උසාවියෙන් දඬුවම් ලබා ඇත්ද යන වග :————.

මා විසින් ඉහත දක්වන ලද තොරතුරු සත්‍ය ඒවා බව සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7-1021—73. 07. 27 දින අංක 70 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන අමාත්‍යාංශය

### දෙමළ මාධ්‍ය පාසල්වල සිංහල ඉගැන්වීම සඳහා දිස්ත්‍රික් සේවා ක්‍රමය යටතේ සහතික පත්‍ර නොලත් උපගුරුවරුන් බඳවා ගැනීම

දිස්ත්‍රික් සේවා ක්‍රමය යටතේ දෙමළ මාධ්‍ය පාසල්වල සිංහල ඉගැන්වීම සඳහා සහතික නොලත් උපගුරුවරුන් බඳවා ගැනීම සම්බන්ධයෙන් 1973. 04. 11 දින අංක : 55 දරණ ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය කෙරෙහි අවධානය යොමු කරවමි.

2. එම නිවේදනයේ 5 වැනි ඡේදයේ (ඇ) අනු ඡේදය යටතේ අම්පාර ජන්ද කොට්ඨාශයේ ස්ථිර පදිංචිය ඔප්පු කිරීමට සමත්වන අයවද කල්මුනේ අධ්‍යාපන දිස්ත්‍රික්කයේ පවත්නා පූරප්පාඩු සඳහා පමණක් ඉල්ලුම් කිරීමට මෙයින් ඉඩදෙනු ලැබේ. ඒ අනුව 1973.05.01 දිනට අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති අය විසින් එකී ගැසට් පත්‍රයෙහි දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රයෙහි සඳහන් අන්දමට පිළියෙළ කරන ලද ඉල්ලුම් පත් 1973.08.20 දින හෝ ඊට ප්‍රථම " ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය. කල්මුනේ " යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි කරන ලද තැපැලෙන් යැවිය යුතුය.

පී. උඩුගම,
ලේකම් හා අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

1973 ජූලි මස 12 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

7-889 —73. 07. 27 දින අංක 70 දරන ගැසට් පත්‍රය

## කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

### (තාවකාලික) මෝස්තර සම්පාදක සහකාර තනතුරු

කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ (තාවකාලික) මෝස්තර සම්පාදක සහකාර තනතුරු සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. ඉල්ලුම් පත්‍ර මෙහි දක්වෙන ආකෘතිය අනුව පිළියෙල කර 1973 අගෝස්තු මස 20 වැනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. **වැටුප් පරිමාණය.**—මෙම තනතුර සඳහා ගිමි වාර්ෂික ඒකාබද්ධ වැටුප් පරිමානය රු. 4,152—144×16—රු. 6,456 ක් වනු ඇත. ඒකාබද්ධ වාර්ෂික වැටුප රු. 5,304 ට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමක් සමත් විය යුතුය.

3. **සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :**

(i) මෙම තනතුරු තාවකාලිකය.

(ii) විශ්‍රාම වැටුප් රහිතය.

(iii) රජයේ සේවක අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

4. **අවශ්‍ය අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.**—සියළුම ඉල්ලුම්කරුවන් පහත දක්වෙන සුදුසුකම් වලින් සමන්විත බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) (i) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍යපෙළ) විභාගය සිංහල/දෙමළ භාෂාව, අංකගණිතය/ගණිතය, චිත්‍ර කලාව ඇතුළු විෂයයන් 6 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමර්ථවීම,

නැතහොත්

(ii) ඊට සමාන හෝ උසස් විභාගයකින් සමර්ථවීම.

(ආ) (i) අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්ත රෙදි විවීම/පේෂකම් රෙදි මුද්‍රණය කිරීම, අවුරුදු 3 ක පළපුරුද්ද

හෝ

(ii) පේෂ කර්මාන්තය සම්බන්ධව යටත් පිරිසෙන් අවුරුදු 3 ක පළපුරුද්ද.

(ඇ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත බව.

(ඈ) 1973 අගෝස්තු මස 20 වැනි දිනට වයස අවුරුදු 20 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි බව (දැනටමත් රජයේ සේවයේ නියුක්තව සිටින අයට මෙම උපරිම වයස් සීමාව අදාල නොවේ.)

5. ඉල්ලුම්කරුවන් ස්වකීය ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය. (එම පිටපත් ආපසු එවනු නොලැබේ.)

(අ) උප්පැන්නය ලියාපදිංචිකිරීමේ සහතිකය.
(සැ. යු. උපකෘත පාඨශාලා රෙගුලාසි සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතික හා බෞතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(ආ) උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඇ) මෑතකදී ලබාගත් චරිත සහතික තුනක්.

(ඈ) වෘත්තිය හා/හෝ ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතික.

සංලක්ෂ්‍යය.—ඉහත සඳහන් සහතික ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවක ඒවා ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ ඉල්ලුම් පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

6. දැනට රජය යටතේ හෝ ප්‍රාදේශීය බල මණ්ඩල යටතේ හෝ සේවයේ යෙදී සිටින ඉල්ලුම් කරුවන් ස්වකීය ඉල්ලුම් පත් තම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

7. ඉල්ලුම්කරුවන් ස්වකීය වියදමින් කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයට පැමිණිය යුතුය.

8. ඉල්ලුම් පත්‍රයේ දැක්වෙන කිසියම් තොරතුරක් අසත්‍ය බැව් තෝරා ගනු ලැබීමට ප්‍රථම සොයා ගතහොත්, ඉල්ලුම්කරුවන් නුසුදුස්සන් කිරීමටද, තෝරා ගැනීමෙන් පසුව සොයා ගතහොත් සේවයෙන් පහකිරීමටද සිදුවනු ඇත.

9. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (IIඅ) වැනි ඡේදයේ ආරම්භයෙහි සඳහන් වින්නාවූද, රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාල පොදු කොන්දේසි කෙරෙහි අවධානය කරවනු ලැබේ.

ජී. පී. හත්තොටුව,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (කළමනාකාරීත්ව)
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ වෙනුවට.

1973 ජූලි මස 17 වැනි දින,
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල, කොළඹ—1.

## කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

### තාවකාලික මෝස්තර සම්පාදක සහකාර තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර ආකෘතිය

සැ. යු.—ඉල්ලුම් පත්‍ර බහාලන ලියුම් කවරයේ වම්පස මුදුන් කෙළවරේ "තාවකාලික පේෂ කම් මෝස්තර සම්පාදක සහකාර තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය" යන පාඨය ලියා එය ලියාපදිංචි කළ තැපෑලෙන්, කොළඹ, හේමාස් ගොඩනැගිල්ල, කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ වෙත එවිය යුතුය.

1. සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය හා උපන් ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපත් ඇමිණිය යුතුය).

4. ජාතිය :————.

5. විවාහකද අවිවාහකද යන බව :————.

6. අධ්‍යාපනික සහ/හෝ ශිල්පීය සුදුසුකම් :————.
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)

7. පාඨශාලාවෙන් අස් වූ පසු කළ රැකියා සහ/හෝ හැදෑරූ අභ්‍යාස පිළිබඳ විස්තර :————.

8. මීට කලින් ආණ්ඩුවේ යම්කිසි දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක සේවය කළේ නම් එයින් අස්වීමට හේතු සඳහන් කරන්න :————.

9. යම්කිසි සාපරාධී වරකට කෙදිනක හෝ උසාවියකදී වරද කරු වී ඇත්නම්, එම වරද හා ලැබූ දඬුවම් පිළිබඳ විස්තර සඳහන් කරන්න :————.

10. චරිත සහතික දී ඇති පුද්ගලයින් තිදෙනාගේ නම් සහ පදවි නාම.

(1):————.
(2) :————.
(3) :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

7-988 —73. 07. 27 දින අංක 70 දරන ගැසට් පත්‍රය

---

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### නාවින්න බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනයේ පර්යේෂණ නිලධාරී (ආයුර්වේද සාහිත්‍ය) තනතුර

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ නාවින්නේ බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනයේ පර්යේෂණ නිලධාරී (ආයුර්වේද සාහිත්‍ය) තනතුර සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. පහත සඳහන් ආකෘති පත්‍රයට අනුව පිළියෙල කරගත් අයදුම් පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර, කොළඹ 1, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතු ය :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1973.08.17 වැනි ද.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1973.08.24 වැනි ද.

සටහන් :—

(i) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සළකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(ii) පිටරටවල අයදුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී බාරදීමට අයදුම්කරුවන්ට සිය අභිමතය පරිදි පිළිවන.

(iii) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ශ්‍රී ලංකා ජනරජය යටතේ සේවය සඳහා පත්කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටින යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—(i) මෙම තනතුර ස්ථිරය, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පෞද්ගලික වෛද්‍ය වෘත්තියෙහි යෙදීමට අවසර දෙනු නොලැබේ.

3. **ඒකාබද්ධ වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේය. වර්ෂයකට රු. 6,720 × 360 × 12 හා 480 × 11 රු. 16,320 යි. වර්ෂයකට රු. 11,520 ට හා රු. 14,880 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත.

**සටහන.**—වර්ෂයකට රු. 11,520 ට පෙර වූ කාර්යක්ෂමතා ඉඩඉමෙන් ඔබ්බට උසස් කරනු ලැබීම සඳහා පශ්චාත් උපාධි සුදුසුකම් ලබාගත යුතු අතර, වර්ෂයකට රු. 14,880 ට පෙර වූ කාර්යක්ෂමත කඩඉමෙන් ඔබ්බට උසස් කරනු ලබන්නේ වැඩ හා හැසිරීම පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය අනුවය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව ;

(ආ) 1973.7.27 දිනට අවුරුදු 30 ට, නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතු බව. (උපරිම වයස් සීමාව ආයුර්වේද දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට බලපානු නොලැබේ.)

(ඇ) පිළිගත් ආයුර්වේද විද්‍යාලයක පළමුවැනි පංතියේ ගෞරව ඩිප්ලෝමා සහතිකයක් ඇති බව ;

(ඈ) ආයුර්වේදය පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම් හා ආයුර්වේදය පිළිබඳ මූලික පර්යේෂණ හෝ නොයෙකුත් ප්‍රකාශන පළ කිරීමෙන් ද, ලත් විශිෂ්ඨ කීර්තියක් ඇති බව ;

(ඉ) පාලි දැනුමත් සමග සංස්කෘත පිළිබඳ 1 වෙනි හෝ දෙවෙනි පන්තියේ ගෞරව උපාධියක් හෝ උපාධි තත්ත්වයක සංස්කෘත හා පාළි දැනුමක්.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (**සැ.යු.**—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්‍යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ.යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සළකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයේ හෝ සංයුක්ත මණ්ඩලවල නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු හෝ මණ්ඩලවල ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් තැනට හැර මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතු ය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

සී. ඊ. ඇස්. වීරතුංග,
සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්.

1973.07.17 දින,
කොළඹ 1.
ගාලු මුවදොර,
මහ ලේකම් ගොඩනැගිල්ලේ
සෞඛ්‍ය අමාත්‍යාංශයේ දීය.

අංකය :————
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

**සෞඛ්‍ය අමාත්‍යාංශය**

**ඉල්ලුම් පත්‍ර පෝර්මය**

1. ඉල්ලුම් කරන තනතුර :
————තනතුර
————දෙපාර්තමේන්තුව

2. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

3. තැපැලි ලිපිනය :————.
(ලිපිනයෙහි වෙනසක් වූවහොත් එය වහාම දැනුම් දිය යුතුය)

4. උපන් දිනය :

| වර්ෂය | මාසය | දිනය |
|---|---|---|
| ——— | ——— | ——— |

5. දේශීය ඉල්ලුම් පත්‍ර බාරගන්නා අවසාන දිනය වන විට නියම වයස :

| වර්ෂ | මාස | දින |
|---|---|---|
| ——— | ——— | ——— |

6. ඔබ ලංකා රටවැසියෙක්ද ? පාරම්පරික රටවැසියෙක් ද? එසේ නැතහොත් ලියාපදිංචි වූ රටවැසියෙක් ද යන බව සඳහන් කරන්න. (සටහන අංක (1) බලන්න)

7. උපන් ස්ථානය (සටහන අංක (2) බලන්න) :
(අ) අල්ලුම්කරුගේ :————.
(ආ) පියාගේ :————.
(ඇ) පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.
(ඈ) පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :————

8. (අ) ස්ත්‍රී පුරුෂ භාවය :————
(ආ) ඔබ විවාහක ද ? අවිවාහකද ? වැන්දඹුවෙක්ද, වැන්දඹුවක ද යන බව :————.

9. සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :
(1) සිංහල (2) දෙමළ (3) ඉංග්‍රීසි
(1) ————
(2) ————
(3) ————

10. වයස අවුරුදු 12 න් පසු ඉගෙනීම ලැබූ පාඨශාලා සහ වෙනත් ආයතන :— ,, ,

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය අධ්‍යාපනය | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | ආයතනය | සිට | දක්වා |
| (1) ———— | ——— | ——— | (1) ———— | ——— | ——— |
| (2) ———— | ——— | ——— | (2) ———— | ——— | ——— |
| (3) ———— | ——— | ——— | (3) ———— | ——— | ——— |
| (4) ———— | ——— | ——— | (4) ———— | ——— | ——— |

11. ක්‍රීඩා පිළිබඳව ලබා ඇති විශිෂ්ඨත්ව පිළිබඳ විස්තර සහ ඒ අංශයෙහි ඔබ විසින් උසුලන ලද වගකිවයුතු පදවි පිළිබඳ විස්තර :————.

12. (ඒ) ඔබ ණයගැති භාවයෙන් මිදී සිටින්නේද ? ණය ගැතිව සිටින්නේ නම් ඒ කොපමණකටද ? :————.
(බී) ඔබ සාපරාධි වරදකට උසාවියකදී චෝදනා ලැබූවෙක්ද ? එසේ නම්, දිනයන් සහ නඩු අංකය සමඟ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න :————.

13. අධ්‍යාපන, වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් (ලබා ගන්නා ලද සියලුම උපාධි, විශිෂ්ඨ සමර්ථ වෘත්තීය හා කාර්මික සුදුසුකම් වල විස්තර, ඒවායේ දින, පංතියක් වේ නම් එය, ඒවා සඳහා ගන්නා ලද විෂයයන් සහ ඒවා ලබාගත් ආයතනවල නම් සඳහන් කරන්න) : ————.

14. දැනට නිරත රක්ෂාව හා ඊට ප්‍රථමයෙන් කරන ලද රක්ෂාවල් :————
(රක්ෂාවට බැඳුනු දිනය, ඉන් අස් වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න)

**සැලකිය යුතුයි.**—ආණ්ඩුව යටතේ කළ සේවය අවසන් වීමට හේතුව මෙහි පහළ 16 වැනි කොටුවෙහි සඳහන් කළ යුතුය.

| | පදවිය | සිට | දක්වාද | වාර්ෂික වැටුප රුපියල් |
|---|---|---|---|---|
| (1) | ——— | ——— | ——— | ——— |
| (2) | ——— | ——— | ——— | ——— |
| (3) | ——— | ——— | ——— | ——— |
| (4) | ——— | ——— | ——— | ——— |
| (5) | ——— | ——— | ——— | ——— |
| (6) | ——— | ——— | ——— | ——— |
| (7) | ——— | ——— | ——— | ——— |
| (8) | ——— | ——— | ——— | ——— |

15. විශේෂ සුදුසුකම්.—(දැන්වීමෙහි දක්වෙන විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට ඇත්තේද ? එසේ ඇතහොත් දිනයන් ද ඇතුළුව ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න. විශේෂ සුදුසුකම් කිසිවක් නියම කොට ඇද්දැයි ගැසට් නිවේදනය බලන්න).

16. තවත් තොරතුරු කිසිවක් වේ නම් ඒවා :————.

17. මෙම ඉල්ලුම් පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත්කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දැන සිටිමි.

————,

දිනය :————.

ඉල්ලුම්කරුගේ අත්සන.

සටහන්.—(1) ඔට ලංකාවේ රට වැසියකු වී සිටින්නේ ලියාපදිංචි වීමෙන් නම්, ඔබට නිකුත් කරන ලද රටවැසි සහතිකයේ යොමු අංකය සහ දිනය සඳහන් කරන්න.

(2) ඉල්ලුම්කරු උපන්නේ ලංකාවේ නම් (අ) වලට අතිරේක වශයෙන් (ආ) හෝ (ඇ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු/ඇ උපන්නේ ලංකාවේ නොවේ නම් (අ) වලට අතිරේකව (ආ) සහ (ඇ) හෝ (ඈ) හෝ පිරවිය යුතුයි.

අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම්, ඔහු පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :—

————,

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ පදවි නාමය.

දිනය :————.

7-959—73. 07. 27 දින අංක 70 දරන ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා මහ බැංකුව

### මාණ්ඩලික පංතියේ පුරප්පාඩු

1. මහා බැංකු සේවාවේ මාණ්ඩලික පංතියේ I වැනි ශ්‍රේණියට නිලධාරීන් පත් කර ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

2. අයදුම්කරුවන් ලාංකික පුරවැසියන් විය යුතුය.

3. මූලික සුදුසුකම් :

(i) පිළිගත් විශ්ව විද්‍යාලයකින් අර්ථ ශාස්ත්‍රය, උසස් ගණිතය, සංඛ්‍යා ලේඛන, වාණිජ විද්‍යාව, රාජ්‍ය පරිපාලනය හෝ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පළමුවැනි හෝ දෙවැනි පංතියේ (උසස් පෙළ) ගෞරව උපාධියක් ලබා තිබීම සහ/හෝ

(ii) බැංකු කටයුතු පිළිබඳ විධායක තනතුරු දැරීමෙන් අනුක්‍රමයෙන් ලබාගත් විශේෂිව යුතු පළපුරුද්දක් ඇතිව සිටීම.

සැලකිය යුතුයි.—ඉහත (i) හි දක්වන ලද විෂයයන්ගෙන් ගෞරව උපාධි පරීක්ෂණය සඳහා පෙනී සිට ප්‍රතිඵල බලාපොරොත්තු වන අයටද ඉල්ලුම් කළ හැකිය. එවැනි ඉල්ලුම්කරුවන් තමන්ගේ ප්‍රතිඵල දැනගත් වහාම අප වෙත දැන්විය යුතුය.

4. වැටුප.—අලුතින් බඳවා ගනු ලබන අය සාමාන්‍යයෙන් මුලදී පත් කරනු ලබන්නේ මසකට රු. 655 ක වැටුපක් මත, පරිවාස මාණ්ඩලික නිලධාරීන් වශයෙනි. පරිවාස කාලසීමාව අවුරුදු 2 කි. පරිවාස කාලසීමාව සතුටුදායක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසු මසකට රු. 790—42.50×1 සහ 45×6—රු. 1,102.50 වැටුප් පරිමාණය මත ඔවුන් මාණ්ඩලික පංතියේ I වැනි ශ්‍රේණියට පත් කරනු ලැබේ. පත් කර ගන්නා අයගෙන් විශේෂයෙන් සුදුසු යයි සලකනු ලබන අය ඉහත සඳහන් වැටුප් පරිමාණය මත, I වැනි ශ්‍රේණියේ මාණ්ඩලික පංතියට කෙලින්ම බඳවා ගත හැකිය. එවැනි අය සම්බන්ධයෙන් එක් අවුරුදු පරිවාස කාලසීමාවක් නියම කරනු ලැබේ.

5. මීට අමතරව විවාහ දීමනාවක් (විවාහක නම්) ගෙවනු ලැබේ.

6. අයදුම්පත් පෝරම හා වැඩිදුර විස්තර ශ්‍රී ලංකා මහ බැංකුවේ ආයතන දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැකිය. (අයදුම්පත් පෝරම තැපැලෙන් එවිය යුතු නම් ලිපිනය ලියා මුද්දර ගැසූ දිග කවරයක් එවිය යුතුය.) අයදුම්පත් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.

ආයතන අධ්‍යක්ෂ,
ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ 1.

එසේම " මාණ්ඩලික පංතියේ පුරප්පාඩු " යනුවෙන් ලියුම් කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ පැහැදිලිව ලියා, 1973 අගෝස්තු මස 10 වැනි දිනට හෝ ඊට ප්‍රථම ඔහු වෙත ලැබෙන සේ එවිය යුතුය.

ආයතන අධ්‍යක්ෂ.

—73. 07. 27 දින අංක 70 දරන ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාව

### අධිකාරී පත්වීම් සඳහා පුරප්පාඩු

ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාවේ අධිකාරී පත්වීම් සඳහා පුරප්පාඩු ඇත.

2. ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාවේ අධිකාරී පත්වීම් සඳහා අයදුම් කරන අපේක්ෂකයින්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය :—

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

(ආ) 1973 අගෝස්තු මස 27 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතුය.

(ඇ) නාවික හමුදාධිපති විසින් නියම කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත්වීමට හැකි වන පරිදි නිරෝගී අයෙකු විය යුතුය.

(ඈ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් හෝ ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත්වී සිටිය යුතුය.

**සංලක්ෂ්‍යය :**

(1) අයදුම්කරුවන් රජයේ භාෂා ප්‍රතිපත්තියට, විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතට අනුකූලව පිළිපැදීමට ලැහැස්ති වී සිටිය යුතුය.

(2) නාවික වෘත්තීන්වල, කාර්මික හා සාමාන්‍ය සේවාවන්වල යෙදී ඇති පුද්ගලයින් සම්බන්ධයෙන් විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(3) කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා උපාධිය (පේරාදෙනියේ කෘෂිකර්ම පාසැලෙහි) හෝ ඊට උසස් කෘෂිකර්ම විභාගයකින් සමත්වී සිටින පුද්ගලයින්ටද අයදුම් කළ හැක.

3. ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාවේ නිලධාරියකු සාමාන්‍ය වශයෙන්, එක්තරා අභ්‍යාස පෙළපාලි ගණනකට හා 14 දිනක වාර්ෂික කඳවුරකට සහභාගි විය යුතුය.

4. ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදා රෙගුලාසි අනුව, ස්වේච්ඡා නාවික හමුදාවේ නිලධාරියෙකුට හුදෙක් දැරීමට වන වියදම් පියවා ගැනීම සඳහා යම් යම් වේතන ගෙවනු ලැබේ.

5. ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදා රෙගුලාසි සහ හමුදා පනතින්, පොදු සේවා නීති රීති පාලනය වනු ඇත. ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායක පැනවීම්වල ප්‍රතිශෝධිත සංස්කරණයෙහි 358 වන පරිච්ඡේදය වන නාවික හමුදා පනතේ 7 වැනි සහ 16 වැනි වගන්තිවලට අනුකූලව, ස්වේච්ඡා හමුදා පුද්ගලයකු සක්‍රිය සේවය සඳහා කැඳවීමට යටත් වනු ඇත. එය සම්පූර්ණ සක්‍රිය සේවා කාලය තුළ දී නිත්‍ය හමුදාවේ නිලධාරීන්ට අදාළ වැටුප් හා දීමනා ස්වේච්ඡා නාවික හමුදාවේ පුද්ගලයින්ට ද ගෙවනු ලැබේ.

**6. මෙම පුරප්පාඩු නිත්‍ය හමුදාවේ නොව, ස්වේච්ඡා නාවික හමුදාවේ බවත්, තෝරා ගැනීම වැටුප් ලබන ස්ථිර රැකියාවකට නොවන බවත් අවධාරණයෙන් සඳහන් කරනු ලැබේ.**

7. අයදුම්කරු පුද්ගලිකව හඳුනන වගකිව යුතු පුද්ගලයින් දෙදෙනෙකුගෙන් පසුගිය අවුරුදු දෙක තුළ ලබාගත් චරිත සහතික දෙකක්වත් අඩු වශයෙන් ඉල්ලුම් පතට අමුණා එවිය යුතුය.

8. ඉල්ලුම් පත් ගණනේ හැටියට අවශ්‍යතාවයක් ඇති වුවහොත් ඉහත කොන්දේසි සපුරාලන අය අතුරින් මූලික තේරීමක් කරනු ඇත. ඉන් අනතුරුව, ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් පත් කරනු ලබන තේරීම් මණ්ඩලයක් මගින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර, අවසන් තෝරාගැනීම පවත්වනු ඇත. සම්මුඛ පරීක්ෂණයකට තෝරා ගන්නා ලද අපේක්ෂකයින්ට එවැනි සම්මුඛ පරීක්ෂණයන් පවත්වන ස්ථානය, වේලාව සහ දිනය ලියා දන්වනු ඇත. සම්මුඛ පරීක්ෂණය කොළඹ දී පවත්වනු ලැබේ. මේ සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් රජයෙන් ගෙවනු නොලැබේ. තේරීම් මණ්ඩලයේ සම්මුඛ පරීක්ෂණයට තෝරා නොගන්නා ලද අපේක්ෂකයින්ට ඒ බව දන්වනු ඇත.

9. ඉල්ලුම් පත් පහත දක්වා ඇති ආකාරයට පිළියෙල කර, අණ දෙන නිලධාරි, ස්වේච්ඡා නාවික හමුදාව, කොච්චිකඩේ, කොළඹ 13 යන ලිපිනයට ඉදිරිපත් කළ යුතුය. ඉල්ලුම් පතෙහි ද, එය බහාලන කවරයෙහි වම් පස ඉහළ කෙළවරේ ද, " ඉල්ලුම් පත්‍රය, ස්වේච්ඡා නාවික හමුදාව—අධිකාරී පත්වීම් " යනුවෙන් සඳහන් කළ යුතුය. ඉල්ලුම් පත්‍ර 1973 අගෝස්තු මස 27 දිනට පෙර ස්වේච්ඡා නාවික හමුදා මූලස්ථානයට ලැබිය යුතුය.

ඩී. බී. ගුණසේකර,
කොමදෝරු,
නාවික හමුදාධිපති.

1973 ජූලි 12 වැනි දින,
නාවික හමුදා මූලස්ථානය,
තැ. පෙ. 593,
කොළඹ 1.

**ශ්‍රී ලංකා ස්වෙච්ඡා නාවික හමුදාවේ අධිකාරි පත්වීම් සඳහා අයදුම් පත**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
2. ලිපිනය :————.
3. තදාසන්න තැපැල්/විදුලි පණිවුඩ කාර්යාලය :————.
4. තදාසන්න පොලිස් ස්ථානය :————.
5. උපන් දිනය :————, වයස :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)
6. ජාතිය :————.
7. ඉහත දී (යුද්ධ සේවය ඇතුළුව) යුද්ධ, නාවික, ගුවන් සහ ස්වේච්ඡා හමුදාවල සේවය ඇතොත් දින සහ දැරූ තනතුරු ඇතුළුව සම්පූර්ණ විස්තර දෙන්න :————.
8. මුදා හැරීමේ දී හෝ අස් කිරීමේ දී හැසිරීම :————.
   (මුදා හැරීමේ හෝ අස් කිරීමේ සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)
9. සමත් වූ පරීක්ෂණයන් දින සහ විෂයයන් ඇතුළුව :————.
   (අධ්‍යාපන සහතික පිටපත් ඇමිණිය යුතුය.)
10. උස : අඩි :————, අඟල් :————.
11. විවාහක ද ? අවිවාහක ද ? :————.
12. විශ්ව විද්‍යාලයේ හෝ පාසැලේ දී අත්කරගත් ක්‍රීඩා ශූරතාවන් ————.
13. ඔබේ කීර්තියට හේතුවන පරිදි, ඔබ විශ්ව විද්‍යාලයේ දී හෝ පාසැලේ දී අයත් කරගත් වෙනත් ජයග්‍රහණයන් කවරේ ද ? :————.
14. ඔබේ විශ්ව විද්‍යාල හෝ පාසැලේ කාලය සම්බන්ධයෙන් පහත සඳහන් විස්තර සපයන්න :————.
    විශ්ව විද්‍යාලයේ හෝ පාසැලේ නම :————.
    ඇතුළත් වූ දිනය :————.
    අස් වූ දිනය :————.
15. විශ්ව විද්‍යාලයෙන් හෝ පාසැලෙන් අස්වූ දින සිට යෙදී සිටි රැකියාවක් සම්බන්ධයෙන් පහත සඳහන් විස්තර සපයන්න :—

| ස්වාමියාගේ නම සහ ලිපිනය | රැකියා ස්වභාවය | කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

(දැනට රැකියාව කරන ස්ථානයේ, ස්වාමියාගේ, ස්වේච්ඡා නාවික හමුදාවට බැඳීම සඳහා කැමැත්ත ප්‍රකාශ කරන ලද ලිපියක් ඇමිණිය යුතුය.)

16. චරිත සහතික ලබාගත් පුද්ගලයින්ගේ නම් සහ ලිපිනයන් : ————.
17. අයැදුම්කරු විසින් අත්සන් තැබිය යුතු ප්‍රකාශනය :————.

ඉහත සඳහන් කර ඇති ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මගේ විශ්වාසයේ හා දැනීමේ හැටියට සත්‍ය ඒවා බැව් මෙයින් සහතික කරමි.

————,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :————.

7-855—73. 07. 27 දින අංක 70 දරන ගැසට් පත්‍රය

---

**ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය**

**පුරප්පාඩු**

73. 7. 6 වැනි දින නිකුත් කරන ලද ගැසට් පත්‍රයේ 810 වැනි පිටුවෙහි සඳහන් නිවේදනය සම්බන්ධවයි. එහි අංක 3 යටතේ දැක්වෙන ශීර්ෂපාඨය වන “ කෘෂිකර්ම ව්‍යාප්ති කම්කරුවන් ” යන්න **“කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයන්”** යනුවෙන් සංශෝධනය විය යුතුයි.

සභාපති.

415, බෞද්ධාලෝක මාවත,
කොළඹ 7,
1973 ජූලි මස 17.

7-1010—73. 07. 27 දින අංක 70 දරන ගැසට් පත්‍රය

---

**වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ රැකී රක්ෂා සම්බන්ධතා නිලධාරී තනතුර**

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ රැකීරක්ෂා සම්බන්ධතා නිලධාරි තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත සඳහන් කර ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරගනු ලබන අයදුම්පත් 1973 අගෝස්තු මස 31 දින හෝ එදිනට කලින් කොළඹ 1, තැ. පෙ. 1652, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් නමට එවිය යුතුය.

**සටහන :**—(1) ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

2. අයදුම්පත් හෝ ඒවාට සම්බන්ධ ලිපි තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාදවූ බවට හෝ කෙරෙන කිසියම් පැමිණිල්ලක් ගැන සලකා බැලිය නොහැක. අවසාන දින කිපය දක්වා අයදුම් පත් එවීම ප්‍රමාද කිරීම නිසා සිදුවිය හැකි අලාභහානි එම අපෙක්ෂකයන් විසින්ම දරාගත යුතුය.

2. **සේවයෙහි නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—(1) මෙම තනතුර ස්ථිර හා අර්ථ සාධක අරමුදල් පදනමක් මත වනු ඇත. ඒකාබද්ධ වැටුපෙන් 6% ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට ගෙවීමට සිදුවන අතර, මේ සඳහා රජයේ දායක මුදල ඒකාබද්ධ වැටුපෙන් 9% ක් වනු ඇත. එහෙත් 71. 12. 31 දින ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තත්ත්වයක සිටි රජයේ සේවක යෙකු තෝරා ගනු ලැබුවහොත් ඔහු විශ්‍රාම වැටුප් පදනමක් මත පත් කරනු ලැබේ.

3. **වැටුප් හා දීමනා :**—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වාර්ෂික වැටුප් පරිමාණය මෙසේ ය : රු. 5,736—144×6, 180×8 හා 240×6—9,480 (වර්ෂයකට—රු. 6,312 සහ 7,500 කට පෙර කාර්යක්ෂමතා කඩඉම්).

**සටහන :** විශේෂ සුදුසුකම් හා පළපුරුදු ඇති අයදුම්කරුවෙකු තෝරාගනු ලැබුවහොත්, ආයතන අධ්‍යක්ෂගේ අනුමැතිය ඇතිව, එම විශේෂ සුදුසුකම් හා පළපුරුදු අනුව, ඔහු වැටුප් පරිමාණයේ කිසියම් ලක්ෂයක තබනු ලැබේ. දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවෙකු තෝරාගනු ලැබුවහොත් ඔහුගේ වැටුප තීරණය කරනු ලබන්නේ රජයේ ආයතන සංග්‍රහයේ 7 වැනි පරිච්ඡේදයේ 9 වැනි වගන්තිය අනුවය.

4. **අවශ්‍ය සුදුසුකම් :** සෑම අපේක්ෂකයෙක්ම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරයින් හෝ නීති වෘත්තියේ යෙදීමට හැකි වෘත්තීය සුදුසුකම් ඇතියවුවන් හෝ, රජයේ 10 වසක සේවයක් සම්පූර්ණ කොට ඇති, සිංහල භාෂාව/දෙමළ භාෂාව සහ අංක ගණිතය/ගණිතය/වාණිජ ගණිතය ඇතුළුව විෂයයන් 6 කින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පරීක්ෂණය නැතහොත් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) පරීක්ෂණය දෙවතාවකට වැඩි නොවූ වාර ගණනකින් සමත් වූවන් හෝ විය යුතුය.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අයදුම්කරුවන් අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (රජයේ සේවයේ තනතුරු දරන්නන්ට මෙම වයස් සීමාවන් බල නොපැවැත්වේ.)

(ඇ) විශිෂ්ඨ චරිතයකින් හා මනා යෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත වීම.

5. පහත සඳහන් ලියවිලිවලින් කීපයක් හෝ සියල්ලම ඉල්ලා සිටි විට අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කළ යුතුය :—

(අ) උප්පැන්න ලියාපදිංචි කිරීමේ සහතිකය.

**සැලකිය යුතුයි :**—බෞතීස්ම සහතිකය හෝ අධ්‍යාපන රෙගුලාසි පරිදි ආධාර ලබන පාඨශාලාවන්හි ප්‍රයෝජනය සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතිකය හෝ භාරගනු නො ලැබේ.

(ආ) උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්.

**සටහන :**—(1) අයදුම්පත් වලට කිසිම ලියවිල්ලක් හෝ පිටපතක් නො ඇමිණිය යුතුය.

(2) ඉල්ලූ අවස්ථාවකදි ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

6. රජයේ සේවයේ හෝ සංයුක්ත මණ්ඩලවල සේවයේ නියුක්ත වූවන් තමන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු/සංයුක්ත මණ්ඩල ප්‍රධානියා මගින් එවිය යුතුය.

7. ඉල්ලුම්පත්‍ර හා ඒ හා සම්බන්ධ අනෙකුත් ඕනෑම ලියවිල්ලක් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් වෙත මිස, මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

ඩොරික් ද සූසා,
ලේකම්,
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.

1973 ජූලි මස 13 දින,
අංක 6, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,
තැ. පෙ. 1652.
කොළඹ 1.

ආදර්ශ ඉල්ලුම් පත්‍රය

**වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ රක්ෂිත නිලධාරි තනතුර සඳහා අයදුම් පත්‍රය**

(අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නො ඇමිණිය යුතුය.)

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

2. තැපැල් ලිපිනය (ලිපිනයෙහි වෙනසක් වුවහොත් එය වහා දැනුම් දිය යුතුය) :————.

3. (අ) උපන් දිනය :—

වර්ෂය :————, මාසය :————, දිනය :————.

(ආ) ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනය වන විට නියම වයස :—

වර්ෂය :————, මාසය :————, දිනය :————.

4. ඔබ ලංකා රට වැසියෙක් ද? පාරම්පරික රටවැසියෙක් ද? එසේ නැත් නම් ලියාපදිංචි වූ රටවැසියෙක් ද යන බව සඳහන් කරන්න. (ලියාපදිංචි වූ රටවැසියෙක් නම් සම්පූර්ණ විස්තර සඳහන් කරන්න.) :————.

5. උපන් ස්ථානය :—

(අ) ඉල්ලුම්කරුගේ :————.

(ආ) පියාගේ :————.

(ඇ) පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.

(ඈ) පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :————.

6. (අ) ස්ත්‍රී පුරුෂ භාවය :————.

(ආ) ඔබ විවාහකද, අවිවාහකද, වැන්දඹුවක් ද යන බව :————.

7. සාමාර්ථය ලබා ඇති ඉහලම විභාගය :—

(1) සිංහල :————.

(2) දෙමළ :————.

(3) ඉංග්‍රීසි :————.

8. වයස අවුරුදු 12 න් පසුව ඉගෙනීම ලැබූ පාඨශාලා, විද්‍යාල හා වෙනත් ආයතන :

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය අධ්‍යාපනය | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | ආයතනය | සිට | දක්වා |
| 1. .................... | ......... | ......... | 1. .................... | ......... | ......... |
| 2. .................... | ......... | ......... | 2. .................... | ......... | ......... |

9. ඔබ ණයගැති භාවයෙන් මිදී සිටින්නේ ද? ණය ගැතිව සිටින්නේ නම්, ඒ කොපමණද? :————.

10. ඔබ සාපරාධී වරදකට උසාවියකදී චෝදනා ලැබුවෙක් ද? එසේ නම් දිනයන් සහ නඩු අංකය සමග සම්පූර්ණ විස්තර සඳහන් කරන්න :————.

11. අධ්‍යාපන, වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් : (ලබා ගන්නා ලද සියලුම උපාධි, විශිෂ්ඨ සාමාර්ථ, වෘත්තීය හා කාර්මික සුදුසුකම්වල විස්තර, ඒවායේ දින, පන්තියක් වේ නම් එය, ඒ සඳහා ගන්නා ලද විෂයයන් සහ ඒවා ලබාගත් ආයතන සඳහන් කරන්න.) :————.

12. දැනට නිරත රක්ෂාව හා ඊට ප්‍රථම කරන ලද රක්ෂාවන් : (රක්ෂාවට බැඳුන දිනය, ඉන් අස්වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න.) :————.

| පදවිය | සිට | දක්වා | වාර්ෂික වැටුප රුපියල් |
|---|---|---|---|
| 1. .................... | ......... | ......... | .................... |
| 2. .................... | ......... | ......... | .................... |

**සැලකිය යුතුයි** :—ආණ්ඩුව යටතේ කළ සේවය අවසන් වීමට හේතුව මෙහි 12 වැනි කොටුවේ සඳහන් කළ යුතුයි.

13. තවත් තොරතුරු කිසිවක් වේ නම් ඒවා :————.

14. ඔබ ගැන තොරතුරු විමසිය යුතු ඔබ හොඳට දන්නා හඳුනන පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් ඉදිරිපත් කරන්න :————.

(1) :————.

(2) :————.

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැන ගත හොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දැනසිටිමි.

————.
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

7-878—73. 07. 27 දින අංක 70 දරන ගැසට් පත්‍රය

---

**කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව උප දිසාපති කොට්ඨාශයේ හිද්දැව-තිඹිරියාව කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක ධුරය**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව උප දිසාපති කොට්ඨාශයේ හිද්දැව-තිඹිරියාව කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට ඉල්ලුම්පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිමි :—

පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම්පත් 1973. 08. 17 වන දිනට හෝ ඊට පෙර, පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ එවිය යුතුයි :—

"දිසාපති, කච්චේරිය, කුරුණෑගල."

2. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එක් එක් හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 7.50 ක දීමනාවක් බැගින් ගෙවනු ලැබේ.

3. පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) ඉල්ලුම්පත් භාරගන්නා දිනට, වයස අවුරුදු 30 කට නොඅඩු හා 60 කට නොවැඩි වීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත වීම.

(ඇ) ඉල්ලුම්කරු ඉහත කී කොට්ඨාශයක ස්ථිර පදිංචිකරුවකු වීම.

(ඈ) යටත් පිරිසෙයින් සිංහල හෝ ඉංග්‍රීසි VII වන ප්‍රමාණයෙන් වත් සමත්වී සිටීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. රජයේ සහ සංස්ථාවල සේවකයන්ද, පළාත් පාලන ආයතනවල නියෝජිතයින්ද මෙම තනතුර සඳහා ඉල්ලුම්පත් එවීමට නුසුදුස්සෝ වෙති. ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ.

6. ඉල්ලුම්පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ. අයදුම්පත් ලේඛනගත තැපෑලෙන් එවිය යුතු වේ.

7. **හිද්දැව කොට්ඨාශය** අන්දරවැව, පොතානේගම, හිද්දැව, මකුලැව, මුදියන්නෑගම යන ග්‍රාමසේවක පළාත්වලින්ද,

**තිඹිරියාව කොට්ඨාශය** ඉහළ ඇඹෝගම, අළුත්වැව, තිඹිරියෙව, අත්තරගල්ල, නබඩැව, යන ග්‍රාමසේවක පළාත්වලින්ද සමන්විතය.

චන්ද්‍රානන්ද ද සිල්වා,
කුරුණෑගල දිසාපති.

1973 ජූලි මස 16 දා,
කුරුණෑගල දිසාපති කාර්යාලයේ දී ය.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව උප දිසාපති කොට්ඨාශයේ ගිද්දෑව-තිඹිරියාව කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක ධුර'

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙළපතේ නාමය සමග පැහැදිලි අකුරින්) :————.

2. ලිපිනය :————.

3. ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :————.

4. (අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස : ————.

(ආ) උපන් දිනය සහ ස්ථානය :————,

5. විවාහක අවිවාහක බව :————,

6. අධ්‍යාපන සුදුසුකම් :————.

7. දැනට කරන රක්ෂාව :————.

8. මීට පෙර රැකියාවක් කළේද? එසේ නම් එය පිළිබඳ විස්තර : ————.

9. තමන් සතු දේපොළවල වටිනාකම් සහ ප්‍රමාණයන් විස්තර සහිතව :————.

10. ඉල්ලුම්කරු ණයගැතිව සිටීද? එසේ නම් ඒ පිළිබඳ විස්තර: ————.

11. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුවී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද? :————.

12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————,

13. ග්‍රාමසේවක පළාත :————,

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

7-1019—73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
### ඇබෑර්තු

1. මෙම සංස්ථාවේ පහත සඳහන් තනතුරු සඳහා ලාංකිකයන්ගෙන් අයදුම් පත් මෙයින් කැඳවනු ලැබේ.

2. සම්පූර්ණ විස්තර ඇතුලත් අයදුම් පත් 1973 අගෝස්තු මස 15 වෙනි දින හෝ ඊට පෙර සේවක මණ්ඩල නිලධාරී (රැකියා), ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, අංක 113, ගාලු පාර, කොළඹ 3. යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය.

3. මෙහි දක්වා ඇති වැටුප් ක්‍රමය ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් වේ.

4. රජයේ දෙපාර්තමේන්තුවල හෝ සංස්ථාවන්හි හෝ සේවකයින් විසින් එවනු ලබන අයදුම්පත් සලකා බලනුයේ, ඔවුන් විසින් ඒවා අදාල දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළහොත් පමණි. භාණ්ඩාගාරයේ අංක 666 හා 1965.08.20 වෙනි දින දරන චක්‍ර ලේඛයෙහි දක්වෙන වගන්ති වලට අනුව අදාල නිලධාරියා සිය සේවයෙන් නිදහස් කළ හැකිදැයි යන්න දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානියා විසින් සඳහන් කළ යුතුය.

5. ඉල්ලුම්පත් ලැබුන බව නොදන්වන අතර, මෙම දැන්වීමේ සඳහන් අවශ්‍යතාවනට අනුකූලව පිළයෙල නොවුනු ඉල්ලුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

6. (i) සේවා කොන්දේසි :
තෝරාගනු ලබන අපේක්ෂකයින්—

(අ) සිය ශාරීරික යෝග්‍යතාවය දක්වීම සඳහා පත්වීම ලැබීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතුය.

(ආ) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරනු ලබන ප්‍රමාණයක සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීනත්වයක් සිය පරිවාස කාලය තුලදී ලබාගත යුතුය.

(ඇ) සිය වැටුපෙන් 6% ක් සේවක අර්ථසාධක අරමුදල් සඳහා දායක විය යුතුයි. (ඒ සඳහා සංස්ථාව විසින් 9% ක ප්‍රමාණයක් දායක වනු ඇත.)

(ඈ) සංස්ථාවේ ඕනෑම කාර්යාංශයක් යටතේ දිවයිනේ ඕනෑම පළාතක සේවය කළ යුතුව ඇත.

(ii) තෝරාගනු ලබන අයදුම්කරුවන් අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලැබේ.

| තනතුර හා වැටුප් ක්‍රමය | අවශ්‍ය සුදුසුකම් |
|---|---|
| රසායනික ඉංජිනේරු<br>ඒ—6 ශ්‍රෙණිය<br>රු. 850—1,350<br>————<br>5 × 40 : 6 × 50 | (අ) රසායනික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පිළිගත් විශ්ව විද්‍යාලයකින් විද්‍යාවේදී උපාධියක් ලැබ සිටීම<br>හෝ<br>පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ කාර්මික විද්‍යාලයකින් හෝ රසායනික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා සහතිකයක් හෝ කාර්මික විද්‍යාලයකින් උසස් ජාතික ඩිප් ලෝමා සහතිකය ලැබ ඉන් අනතුරුව රසායනික කර්මාන්තයක හෝ ඊට සමාන තත්ත්වයක රාජකාරිවල නිරතව සිටීම ;<br>හෝ<br>ලන්ඩන් රසායනික ඉංජිනේරු ආයතනයේ විභාගවල I වෙනි II වෙනි කොටස් වලින් මුදවාලීමට හැකිවන අධ්‍යාපනික සුදුසුකම් ලැබ සිටීම.<br>(ආ) වයස අවුරුදු 35ට වඩා අඩුවීම යෝග්‍ය වේ.<br>(ඇ) දිවයිනෙන් බැහැරව සිටින්නේ නම් පත්වීම ලැබ දෙවසරක් ඇතුලත වැඩ භාර ගැනීමට හැකි තත්ත්වයක සිටිය යුතුය. |

| තනතුර හා වැටුප් ක්‍රමය | අවශ්‍ය සුදුසුකම් |
|---|---|
| අනතුරු නිලධාරි<br>බී—1 ශ්‍රෙණිය<br>රු. 560—775<br>————<br>7 × 20 : 3 × 25 | (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඒ හා සමාන වෙනත් විභායකින් සමත් වී සිටිය යුතුය.<br>(ආ) මෝටර් ප්‍රවාහන ආඥා පනතෙහි දක්වෙන වගන්ති ගැන දැනීමක් තිබිය යුතුය.<br>(ඇ) මෝටර් ප්‍රවාහන ආඥාපනත අනුව කටයුතු<br>(ඈ) අනතුරු සිදුවන ස්ථානයන්හි විමර්ෂන කට යුතු කිරීමේ හා අනතුරු සිදුවීමෙන් පසු වාර්තා පිළියෙල කිරීමේ හැකියාවක් තිබිය යුතුය.<br>(ඉ) බරවාහන පැදවීමේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය.<br>(ඊ) පොලිස් සේවයෙහි පලපුරුදුකම් ඇති අපේක්ෂකයින්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.<br>(උ) මෙම ක්ෂෙත්‍රයෙහි අවශ්‍ය පමණට සුදුසුකම් හා පළපුරුදුකම් ලබා ඇති අපේක්ෂකයන් නියමිත වැටුප් ක්‍රමයේ සුදුසු වැටුප් ලක්ෂ්‍යයක් මත පත් කිරීම ගැන සළකා බලනු ලැබේ. |

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පාලන),
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව.

113, ගාලුපාර,
කොළඹ 3.

7-944—73.07.27 දින අංක 70 දරන ගැසට් පත්‍රය

## ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය

### විදුලි ඉංජිනේරුවරුන් සඳහා පුරප්පාඩු

වලවේ යෝජනා ක්‍රමයෙහි විදුලි ඉංජිනේරුවකුගේ තනතුරක් සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් අවුරුදු 22 සිට 35 දක්වා වූ වයස් සීමාවන් හි සිටිය යුතු අතර, පිළිගත් විශ්ව විද්‍යාලයකින් විදුලි ඉංජිනේරු ශිල්පය පිළිබඳ ලත් උපාධියක් ද සහිතව අවුරුදු දෙකක අවම පළපුරුද්දක්ද ඔවුන්ට තිබිය යුතුයි.

මණ්ඩලයේ සේවයෙහි V වැනි ශ්‍රේණියට පත්වීම කරනු ලබන අතර වැටුප් පරිමාව අවුරුද්දකට රු. 8,520—6×240—රු. 9,960 වේ. වෘත්තිය සුදුසුකම් ඇති ඉල්ලුම්කරුවන් මණ්ඩලයේ සේවයේ IV ශ්‍රේණියට පත් කරනු ලබන අතර වැටුප් පරිමාව අවුරුද්දකට රු. 10,920—12×300—රු. 14,520 වේ.

අයදුම් පත් මෙම කාර්යාලයෙන් ලබාගත් ආකෘති පත්‍ර මත සකස් විය යුතුයි. අයදුම්පත් ආකෘති පත්‍ර තැපැලෙන් ලබා ගැනීම සඳහා කරන ඉල්ලුම් තමාගේ නම සහ ලිපිනය දක්වෙන, මුද්දර ගැසූ කවරයක් සමග එවිය යුතුයි.

අයදුම්පත් 1973 අගෝස්තු මස 15 වැනි දින හෝ ඊට ප්‍රථම මෙම කාර්යාලයට ලැබෙන සේ පහත අත්සන් කර ඇති අය වෙත ඉදිරිපත් කළ යුතුයි.

සභාපති.

415, බෞද්ධාලෝක මාවත,
කොළඹ 7.

7-1013—73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

## අනුරාධපුර දිස්ත්‍රික්කයේ කලාගම් පලාතේ (බලලුවැව) මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය

කලාගම් පළාත කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතුකොට ගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිඑකකට නොඅඩු භාර්යාවන් ජීවත්ව සිටින පුරුෂ මුස්ලිම්වරුන් ගෙන් ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත්වන අයට තිබිය යුතු අධ්‍යාපනය හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියලු විස්තර මෙම කාර්යාල යේ හා ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාල, ග්‍රාම සේවක කාර්යාල, පළාත් පාලන ආයතන කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොළවල් හා සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාල වල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් වල ඇතුළත් වේ.

3. සියලුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1973 අගෝස්තු මස 31 වෙනි දින හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුයි.

ධම්සිරි ජයසේන,
අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙනුවට.

දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය,
අනුරාධපුර,
1973 ජූලි 10 දින.

7-862—73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ පන්තල ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ මාකඳුර කන්දේගෙදර කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක ධුර

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පන්තල ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ මාකඳුර, කන්දේගෙදර කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක ධුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට ඉල්ලුම් පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිමි.

පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම් පත් 1973. 08. 17 වන දිනට හෝ ඊට පෙර, පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ එවිය යුතුයි :—

"දිසාපති, කච්චේරිය, කුරුණෑගල."

2. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එක් එක් හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 7.50 ක දීමනාවක් බැගින් ගෙවනු ලැබේ.

3. පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) ඉල්ලුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30 කට නොඅඩු හා 60 කට නොවැඩිවීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත වීම.

(ඇ) ඉල්ලුම්කරු ඉහතකී කොට්ඨාශයක ස්ථිර පදිංචිකරුවකු වීම.

(ඈ) යටත් පිරිසෙයින් සිංහල හෝ ඉංග්‍රීසි 7 වන ප්‍රමාණයෙන් වත් සමත්වී සිටීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. රජයේ සහ සංස්ථාවල සේවකයන්ද, පළාත් පාලන ආයතන වල නියෝජිතයින්ද මෙම තනතුර සඳහා ඉල්ලුම් පත් එවීමට නුසුදුස්සෝ වෙති. ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ.

6. ඉල්ලුම් පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ. අයදුම් පත් ලේඛනගත තැපැලෙන් එවිය යුතු වේ.

7. මාකඳුර කොට්ඨාශය-නාලවලාන, මාකඳුර, ගොනුල්ල, සඳලංකාව යන ග්‍රා. සේ. පළාත්වලින්ද, කන්දෙගෙදර කොට්ඨාශය රද්දලාන, කන්දේගෙදර, වෙල්පල්ල යන ග්‍රා. සේ. පළාත්වලින්ද සමන්විතය.

චන්ද්‍රානන්ද ද සිල්වා,
කුරුණෑගල දිසාපති.

1973 ජූලි මස 16 වන දා,
කුරුණෑගල, දිසාපති කාර්යාලයේ දී ය.

### කුරුණෑගල දිස්ත්‍රික්කයේ පන්තල ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ මාකඳුර-කන්දේගෙදර කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක ධුර

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙළපතේ නාමය සමග පැහැදිලි අකුරින්) :————.

2. ලිපිනය :————.

3. ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :————.

4. (අ) අයදුම් පත් භාරගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස: :————.

   (ආ) උපන් දිනය සහ ස්ථානය :————.

5. විවාහක අවිවාහක බව :————.

6. අධ්‍යාපන සුදුසුකම් :————.

7. දැනට කරන රක්ෂාව :————.

8. මීට පෙර රැකියාවක් කළේද? එසේ නම් එය පිළිබඳ විස්තර :————.

9. තමන් සතු දේපොළවල වටිනාකම් සහ ප්‍රමාණයන් විස්තර සහිතව :————.

10. ඉල්ලුම්කරු ණයගැතිව සිටීද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

11. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුවී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද? :————.

12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

13. ග්‍රාමසේවක පළාත :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

7-1020—73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

මගේ අංකය : ඊඕජේ. 20/72.

**සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

V ශ්‍රේණියේ කම්කරු තනතුරක් සඳහා
(බල්ලන් ඇල්ලීම)

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ V ශ්‍රේණියේ කම්කරු තනතුරක් සඳහා (බල්ලන් ඇල්ලීම) පහත සඳහන් සුදුසුකම් ඇති ලාංකිකයන් ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

අයදුම් පත් මෙහි පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව පිළියෙල කොට 1973. 8. 15 දිනට පෙර ලැබෙනසේ කොළඹ 10 මරදානේ ඩීන්ස් පාරේ, ඇන්. ටී. අයි. ගොඩනැගිල්ලේ වසංගත රෝග අංශයේ මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය නිලධාරි වෙත එවිය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—රු. 2,100—5×54—237 (වාර්ෂික ඒකාබද්ධ)

3. මෙම පත්වීම අර්ථ සාධක අරමුදල් පදනමක් මත වනු ඇත.

4. **වයස.**—වයස 18 නොඅඩු වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතු අතර, මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත විය යුතුය.

5. **අධ්‍යාපන සුදුසුකම්.**—කියවීමට හා ලිවීමට හැකියාව තිබිය යුතුය.

6. **පලපුරුද්ද.**—බල්ලන් ඇල්ලීම පිළිබඳ පලපුරුද්දක් ඇති අය ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

7. ග්‍රාම සේවක ඇතුළු දෙදෙනෙකුගෙන් ලබාගත් චරිත සහතික වල පිටපත් 2ක් අමුනා එවිය යුතුය.

ජී. අමරසේන,
සෞ. සේ. අධ්‍යක්ෂ වෙනුවට,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)

**අයදුම් පත්‍රය**

1. නම :————.
2. වයස :————.
3. උපන් දිනය :————.
4. ලිපිනය :————.
5. පලපුරුද්ද :————.
6. චරිත සහතික නිකුත් කල අයගේ ලිපිනය :————.

ඉහත සඳහන් තොරතුරු මගේ දැනීමේ හැටියට නිවැරදි බව සහතික කරමි.

————,
ඉල්ලුම් කරුගේ අත්සන.

දිනය :————.

7-954—73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

**ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ආධුනික සැලසුම්කරු (සිවිල්) තනතුරු**

දුම්රිය සේවයේ මාර්ග හා කර්මාන්ත උප දෙපාර්තමේන්තුවේ ආධුනික සැලසුම්කරු (සිවිල්) තනතුරු සඳහා මෙයින් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. ඉල්ලුම් පත්‍ර පහත දක්වා ඇති ආකෘතියට අනුව පිළියෙල කොට 1973 අගෝස්තු මස 10 වෙනි දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. **වැටුප් පරිමාණය.**—මෙම තනතුරට හිමි වාර්ෂික ඒකාබද්ධ වැටුප් පරිමාණය රුපියල් 3,090—90—රු. 3,180 කි. (1969.10.01 වෙනි දිනට පෙර අනුරූපව පැවති මූලික වැටුප් පරිමාණය රු. 1,032—72—රු. 1,104 වේ.)

3. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.**—(i) මෙම තනතුරු තාවකාලිකය ; රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක වීමට යටත් ය. තෝරාගනු ලබන්නන් දෑවුරුදු ආධුනික කාලසීමාවකට භාජනය කරනු ලැබේ.

(ii) ආධුනික කාල සීමාව තුලදී ඔවුන් අනිකුත් නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණවලට අමතර වශයෙන් ලංකා කාර්මික විද්‍යාලයයේ (ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ කටුබැද්ද මණ්ඩපයේ) සවස් වරුවේ පවත්වනු ලබන පන්තිවලට සහභාගි වී නියමිත පරීක්ෂණයන්ගෙන් සාමාර්ථය ලැබිය යුතුය.

(iii) තෝරාගෙන, පත් කරනු ලැබූ වහාම ඉල්ලුම්කරුවන් විසින් ආධුනික කාලය සම්පූර්ණකර II වැනි පන්තියේ සැලසුම් කරුවන් වශයෙන් පත්වීම් ලැබීමෙන් පසුව වර්ෂ 15ක කාල සීමාවක් ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවය කරන බවට ගිවිසුම කට හා බැඳුම්කරයකට අත්සන් තැබිය යුතුය.

(iv) ආධුනිකයකුගේ ගිවිසුම, අසතුටුදායක හැසිරීම නිසා හෝ පුහුණුවෙන් සතුටුදායක ප්‍රගතියක් නොලබනවා නම් හෝ දෙපාර්තමේන්තු පරීක්ෂණයන් ගෙන් හා කාර්මික විද්‍යාලයේ පරීක්ෂණයන් ගෙන් අසමත් වුව හොත් හෝ දිගටම පුහුණු කරගෙන යාම මොන යම් හේතුවක් නිසා හෝ දෙපාර්තමේන්තුවට ඵලදායක නොවනවා නම් හෝ කලින් දැනුම් දීමක් නොදී අවලංගු කල හැකිය.

(v) පත්වීම ලැබීමට ප්‍රථමයෙන් ඔවුන් සම්මත අක්ෂි දෘෂ්ටි පරීක්ෂණයකින් සමත විය යුතුය,

(vi) ආධුනික කාලය සතුටුදායක ලෙස සම්පූර්ණ කිරීමෙන් හා නියමිත විභාගයන් ගෙන් සාමාර්ථය ලැබීමෙන් පසුව ආධුනිකයින් රු. 3,432—144—රු. 6,456 ඒකාබද්ධ වැටුප් පරිමාණයන් මත II වැනි පන්තියේ සැලසුම්කරුවන් වශයෙන් පත් කරනු ලැබේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—හැම ඉල්ලුම්කරුවකු විසින්ම තමා පහත සඳහන් සුදුසුකම් වලින් යුක්ත බවට සාක්ෂි ඉදිරිපත් කල යුතුය.

(අ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත බව ;

(ආ) 1973. 08. 10 වෙනි දිනට වයස අවුරුදු 16 ට නොඅඩු හා අවුරුදු 24 ට නොවැඩි බව ;

(ඇ) (i) ශුද්ධ ගණිතය හෝ ව්‍යවහාරික ගණිතය සහ භෞතික විද්‍යාව විෂයයන් වශයෙන් ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය

(ii) දෙකකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ සිංහල/දෙමළ භාෂාව, ශුද්ධ ගණිතය හෝ ව්‍යවහාරික ගණිතය සහ භෞතික විද්‍යාව ඇතුළුව විෂයයන් හයකින් සමත් වී සිටීම හෝ

(iii) ශුද්ධ ගණිතය හෝ ව්‍යවහාරික ගණිතය සහ භෞතික විද්‍යාව විෂයයන් වශයෙන් ඇතිව ඉහත සඳහන් විභාග වලට වඩා උසස් විභාගයකින් සාමාර්ථය ලැබ තිබීම.

(ඈ) (i) ලංකා කාර්මික විද්‍යාලයයේ කටුබැද්දේ කාර්මික විද්‍යායතනයේ (ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ කටුබැද්ද මණ්ඩපය) සැලසුම්කරුවන් සඳහා නියමිත එක් අවුරුදු පූර්ණ කාල පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර ප්‍රවිනතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබීම හෝ

(ii) මහනුවර හෝ යාපනයේ කණිෂ්ඨ කාර්මික ආයතනයේ සැලසුම්කරුවන් සඳහා නියමිත එක් අවුරුදු පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර ඒ පිළිබඳ ප්‍රවීණතා සහතිකය ලබා තිබීම.

5. ඉල්ලුම්කරුවන් විසින් පහත සඳහන් ලියවිලි වල පිටපත් සවකීය ඉල්ලුම් පත්‍ර වලට අමුණා එවිය යුතුය.

(i) මෑතකදී ලබාගත් චරිත සහතික තුනක්.
(ii) උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සහතිකය.
(iii) උසස්ම අධ්‍යාපන සහතිකය.
(iv) සැලසුම්කරු වෘත්තිය පිළිබඳ ප්‍රවීණතා සහතිකය.

සටහන.—මෙම පිටපත් ආපසු එවනු නොලැබේ.

6. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි ඡේදයේ ආරම්භයෙහි සඳහන් වන්නාවූද, රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාල වන්නාවූද, පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

බී. ඩී. නවරත්න,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

1973 ජූලි මස 17 දින,
දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්‍යාලය,
මරදාන, කොළඹ 10.

ආදර්ශ ඉල්ලුම් පත්‍රය

**ල. දු. සේ. ආධුනික සැලසුම්කරු (සිවිල්) තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය**

(සැ. යු.—ඉල්ලුම් පත්‍රය බහාලන ලියුම් කවරයේ වම් පස මුදුන් කෙළවරේ "ආධුනික සැලසුම්කරු (සිවිල්) තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය" යන පාඨය ලියා එය ලියාපදිංචි කළ තැපෑලෙන් කොළඹ 10, දුම්රිය දෙපාර්තමේන්තුවේ, දුම්රිය සාමාන්‍යාධිකාරි වෙත එවිය යුතුය.)

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. (i) උපන් දිනය හා උපන් ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපත් ඇමිණිය යුතුය)
(ii) 1973.08.10 වෙනි දිනට වයස :— අවුරුදු :— මාස :—
4. ජාතිය :————.
5. විවාහකද, අවිවාහකද, යන බව :————.
6. (i) අධ්‍යාපන සුදුසුකම් :————.

6. (i) අධ්‍යාපන සුදුසුකම් :————.
(ii) ශිල්පීය සුදුසුකම් :————.
(අධ්‍යාපන හා ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතික පිටපත් ඇමිණිය යුතුයි)

7. පාඨශාලාවෙන් අස්වූ පසු කළ රැකියා සහ/හෝ හැදෑරූ අභ්‍යාස පිළිබඳ විස්තර :————.

8. මීට කලින් ආණ්ඩුවේ යම්කිසි දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක සේවය කළේ නම් එයින් අස්වීමට හේතුව සඳහන් කරන්න.

9. යම් කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකදී වරදකරු වී ඇත්නම් එම වරද හා දඩුවම පිළිබඳ විස්තර සඳහන් කරන්න :————.

10. චරිත සහතික දී ඇති පුද්ගලයන් තිදෙනාගේ නම් සහ පදවි
නාම :————.

————,
අත්සන.

දිනය :————.

7-963—73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

ලංකා ගුවන් විදුලි සංස්ථාව

පුරප්පාඩු

**සංස්ථාවේ ගණකාධිකාරී තනතුර සඳහා ලාංකිකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**සුදුසුකම් හා පළපුරුද්ද.**—ලංකා චාර්ටර්ඩ් ගණකාධිකාරී ආයතනයේ මධ්‍ය පරීක්ෂණය හා එම සුදුසුකම ලබා ගැනීමෙන් පසුව යමත් පිරිසෙයින් අවුරුදු 3 කට නොඅඩු පළපුරුද්ද ; **හෝ**

ලංකා කාර්මික විද්‍යාලයේ ගණකාධිකරණය පිළිබඳ ඩිප්ලෝමාවක සහිතව අවුරුදු 8කට නොඅඩු පශ්චාත් පළපුරුද්දක්.

උපාධි සහතිකයක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස ගණන් ගැනේ. රජයේ සංස්ථාවක හෝ විශාල ආයතනයක ගණකාධිකාරී වරයෙකු ලෙස පළපුරුද්ද අතිරේක සුදුසුකමක් වේ.

**වයස.**—අවුරුදු 35ට අඩු විය යුතුය.

**වැටුප් ක්‍රමය.**—සියලු දීමනා සහිතව මාසික රු. 1,000—1,500 (50×10) කි.

මෙම දැන්වීම අග ඇති ආකෘතිය අනුව සැපයිය යුතු අයදුම්පත් 1973. 08. 10 වැනි දිනට පෙර ලැබෙන සේ, කොළඹ 7, ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයේ ඉහළ වම් කෙළවර "ගණකාධිකාරී" යන්න පැහැදිලිව ලිවිය යුතුය.

ඔස්වල්ඩ් තිලකරත්න,
අධ්‍යක්ෂ ජනරාල්.

1973 ජුලි මස 12 වැනි දින,
කොළඹ 7.

ආදර්ශ අයදුම්පත

ගණකාධිකාරී තනතුර සඳහා වූ අයදුම්පතයි

1. සම්පූර්ණ නම :————.
(අ) මුල් අකුරු සහිත නම (මහත්මයාද, මහත්මියද, මෙනවියද යන වග සඳහන් කරන්න) :————.
(ආ) ලිපිනය :————.

2. උපන් දිනය හා ස්ථානය :————.
(අ) 1973. 08. 10 දිනට වයස :— අවු : මාස : දින : (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි). :————

3. ජාතිය :————.

4. අධ්‍යාපන හා පුහුණුවීම් :—

| ඉගෙනීම ලැබූ පාසැල් හා ආයතන | දින......සිට ........දක්වා | සමත්වී ඇති විභාග | දරු වගකිව යුතු තත්ත්වයන් හා සෙසුණු වැදගත් පරිබාහිර කටයුතු |
|---|---|---|---|

5. සමත්වී ඇති උසස්ම විභාග :—
(i) (අ) සිංහල :————.
(ආ) දෙමළ :————.
(ඇ) ඉංග්‍රීසි :————.
(ii) ගණකාධිකරණය පිළිබඳ ලබාගත් සුදුසුකම් (සහතික වල පිටපත් පමණක් ඇමිණිය යුතුය) :————.

6. පළපුරුද්ද :————.

7. ඔබගේ පෞද්ගලික ජීවිතය ගැන හොඳින් දන්නා නෑයන් නොවන තිදෙනෙකුගේ නම්, ලිපිනය හා තත්ත්ව :—
(1)
(2)
(3)

8. චරිත සහතික ලබාගෙන ඇති අයගේ නම් හා තනතුරු :————.
(1)
(2)
(3)

9. වෙනත් විස්තර :————.

10. මෙම අයදුම්පතෙහි ම විසින් ඇතුළත් කොට ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බව සහතික කරමි. තෝරා ගැනීමේදී හෝ තෝරා ගැනීමට පෙර මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හා වැරදි ඒවා බව හෙළිවුවහොත්, මා යථෝක්ත තනතුර සඳහා නුසුදුස්සකු වන බවත්, පත්වීම ලද පසු වරදක් හෙළිවුවහොත්, කිසිම වන්දියක් නැතිව සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බවත්, මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7–1011—73. 07. 27 දින අංක 70 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයට ශිෂ්‍යයන් බඳවා ගැනීම—1974

1. රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ වෛද්‍ය කලානිධි බී. ඒ. ඇම්. ඇස්. උපාධි පාඨමාලාව හැදෑරීමට ශිෂ්‍ය ශිෂ්‍යාවන් බඳවා ගැනීම සඳහා අයදුම්පත් බාරගනු ලැබේ. ඒ සඳහා නියමිත සුදුසුකම් ඇති අපේක්ෂක අපේක්ෂිකාවන් මෙහි පහත දක්වෙන ආකෘති පත්‍රය අනුව තමන් විසින්ම සකස් කරගන්නා ලද ඉල්ලුම් පත්‍ර නිසි අයුරින් සම්පූර්ණකර 1973 අගෝස්තු 29 වැනිදට හෝ ඊට පෙර පහත දක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලිපිනය : ලේඛකාධිකාරී,
ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය,
බණ්ඩාරනායක පුර,
රාජගිරිය.

2. ඉගැන්වීමේ අංශ.—වෛද්‍යකලානිධි, බී.ඒ.ඇම්.ඇස්. උපාධිය සඳහා විද්‍යාලයීය අධ්‍යාපනය අංශ තුනකින් යුක්ත වේ.

(i) ආයුර්වේද අංශය.
(ii) සිද්ධ අංශය.
(iii) යුනානි අංශය.

ආයුර්වේද පාඨමාලාව ආයුර්වේද සහ දේශීය වෛද්‍ය ක්‍රම අනුව සිංහල භාෂා වෙන්ද, සිද්ධ පාඨමාලාව සිද්ධ වෛද්‍ය ක්‍රමය අනුව දෙමළ භාෂා වෙන්ද, යුනානි පාඨමාලාව යුනානි වෛද්‍ය ක්‍රමය අනුව ඉංග්‍රීසි භාෂාවෙන්ද උගන්වනු ලැබේ.

3. නියමිත සුදුසුකම් ඇති ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම තමන් කැමති පාඨමාලාවක් හැදෑරීමට ඉල්ලුම් පත්‍ර එවිය හැකිය. **පුද්ගල පක්ෂයෙන් එවනු ලබන ඉල්ලුම් පත්‍ර පමණක් බාරගනු නොලැබේ.**

4. වයස.—1974 ජනවාරි 1 වැනි දිනට අවුරුදු 17 ට නොඅඩු විය යුතුය.

5. **අධ්‍යාපනික සුදුසුකම්:**—(i) සෑම අපේක්ෂකයෙක්ම යටත් පිරිසෙයින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) (භාෂාව, ගණිතය ඇතුළුව යටත් පිරිසෙයින් එක් වරකට විෂයයන් 5 ක් සහිතව දෙවරකදී අඩු වශයෙන් මෙහි 5(v) උපඡෙදයේ සඳහන් විෂයයන්ගෙන්) විෂය 6කින් සමත්ව සිටිය යුතු අතර, ඉන් විෂයයන් 4 කට සම්මාන ලබා සිටිය යුතුය.

සහ

(ii) අ.පො.ස. (උසස් පෙළ) විෂයයන් දෙකක් සමත්ව සිටිය යුතුය.

සටහන :

(අ) අඩුම වශයෙන් ආයුර්වේද/සිද්ධ/යුනානි වෛද්‍ය පරම්පරා දෙකකින් පැවත එන බවට සාමදාන විනිශ්චයකාර/ආදායම් පාලක නිලධාරි සහතිකයකින් සනාථ කිරීම, හෝ

(ආ) විද්‍යා විෂයයන්ගෙන් සමත්ව සිටීම, (අ.පො.ස. සාමාන්‍ය පෙළ හෝ උසස් පෙළ) හෝ

(ඇ) සංස්කෘත/උර්දු යන භාෂාවන් සම්බන්ධව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සම්මාන සාමාර්ථයක් හෝ එවැනි තත්වයක දැනුමක් පවත්නා බැව් පිළිගත හැකි (රජය පිළිගත් පිරිවෙන් ආදී ආයතනයක) සහතිකයකින් තහවුරු කිරීම, හෝ යන කරුණු සඳහා විශෙෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(iii) අ.පො.ස. (උසස් පෙළ) වැඩිපුර ලබා තිබෙන සාමාර්ථයයන් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සම්මාන මට්ටමෙහිලා පිළිගනු ලැබේ.

(iv) අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිට ප්‍රතිඵල අපෙක්ෂාවෙන් සිටින අයගෙන්ද ඉල්ලුම් පත්‍ර බාරගනු ලැබේ. එහෙත් විද්‍යාලයට ඇතුලු කර ගන්නා දිනට පෙර ඉහත සඳහන් සුදුසුකම් නොලැබුවහොත් විද්‍යාලයට ඇතුලත් කරගනු නොලැබේ.

(v) **නියමිත විෂයයන්.**—සිංහල භාෂාව, සිංහල සාහිත්‍යය, දෙමළ භාෂාව, දෙමළ සාහිත්‍යය, ඉංග්‍රීසි භාෂාව, ඉංග්‍රීසි සාහිත්‍යය, සංස්කෘත භාෂාව පාලි භාෂාව, උර්දු භාෂාව, අරාබි භාෂාව/අංක ගණිතය, ව්‍යවහාරික ගණිතය ශුද්ධ ගණිතය, උසස් ගණිතය/බුද්ධ ධර්මය, හින්දු ධර්මය, ක්‍රිස්තියානි ධර්මය, ඉස්ලාම් ධර්මය/රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, උද්භිද විද්‍යාව/ ඉතිහාසය, භූගෝලය, ප්‍රජාචාරය, ආර්ථික විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, කෘෂිකර්මය, චිත්‍රකර්මය, සාමාන්‍ය විද්‍යාව සහ ආයුර්වේද විද්‍යාල සහ ආරෝග්‍යශාලා මණ්ඩලය මගින් අනුමත කරනු ලබන අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට අයත් අනෙක් විෂයයන්ද වේ.

6. **ප්‍රවේශ පරීක්ෂාව.**—ඉහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂක අපේක්ෂිකාවන් අතරින් විද්‍යාලයට ඇතුලත් කර ගැනීම සඳහා සුදුසු අය ලිඛිත හා සම්මුඛ පරීක්ෂණයක මාර්ගයෙන් තෝරා ගනු ලැබේ. ලිඛිත පරීක්ෂණ පරිපාටිය මෙසේයි.—

(අ) වාක්‍ය රචනාව (පැය 1½ යි) ලකුණු 100 යි.

(ආ) භාෂාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) (පැය 2 යි) ලකුණු 100 යි.

(ඇ) සාමාන්‍ය බුද්ධිය හා දැනුම (පැය 1½යි) ලකුණු 100 යි.

සටහන :

(i) ආයුර්වේද පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන්ට සිංහල භාෂාවද, සිද්ධි පාඨමාලාව හදරන්නට බලාපොරොත්තු වන අයට දෙමළ භාෂාවද, යුනානි පාඨමාලාව හදරන්ට බලාපොරොත්තු වන අයට ඉංග්‍රීසි භාෂාවද භාෂා මාධ්‍යය වේ.

(ii) ලිඛිත පරීක්ෂණයෙන් නියමිත ලකුණු ප්‍රමාණය ලබාගත් අපෙක්ෂක අපේක්ෂිකාවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ.

7. ඇතුලත්වීමේ ලිඛිත පරීක්ෂණය සැප්තැම්බර් මස 3 වැනි සතිය තුලදී පැවැත්වීමට අදහස් කෙරේ. පරීක්ෂණය පවත්වන දිනය හා ස්ථානය පසුව දන්වනු ලැබේ. (මේ ලිඛිත පරීක්ෂණය පවත්වනු ලබන්නේ විද්‍යාලයට වර්ෂයකට ඇතුලත් කර ගැනීමට නිර්දේශිත ශිෂ්‍ය සංඛ්‍යාවට වඩා අපෙක්ෂක අපෙක්ෂිකාවන් ඉදිරිපත් වුවහොත් පමණි.)

8. සෑම ඉල්ලුම් පත්‍රයකම රු. 15 ක් වටිනාකම ඇති මුද්දර අලවා මෙහි 13 වැනි ඡෙදයෙහි සඳහන් නිලධාරියකු ඉදිරිපිටදී අත්සන් තබා සහතික කළ යුතුය. මොනම හේතුවක් නිසාවත් මුද්දර ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

9. අයදුම් පත්‍ර සමඟ පහත සඳහන් සහතිකවල පිටපත් අමුනා එවිය යුතුය.

(i) රිජිස්ට්‍රාර් ජනරාල් විසින් හෝ දිස්ත්‍රික් රිජිස්ට්‍රාර් විසින් නිකුත් කළ උප්පැන්න සහතිකය.

(ii) අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතික (සහතිකවල මුල් පිටපත් නොඑවිය යුතුය.)

(iii) තම කොට්ඨාශයේ ග්‍රාමසේවක නිලධාරියාගේ සහතිකයක් ඇතුලු චරිත සහතික තුනක පිටපත්.

10. **හඳුනා ගැනීමේ පත්‍ර.**—සියලු අපෙක්ෂක අපෙක්ෂිකාවන් විසින් ලිඛිත පරීක්ෂණය පැවැත්වෙන විභාග ශාලාව තුලදී තමන් පෙනී සිටින එක් එක් විෂය වෙනුවෙන් තමන් හැඳිනගත හැකි පරිදි සාධක ඉදිරිපත් කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් සෑහේ.

(i) පෝස්ට්මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරණ ලද හැඳින්වීමේ පත්‍රයක් හෝ,

(ii) පරීක්ෂණය පවත්වන දිනට පෙර අවුරුදු 5 ක් ඇතුලත රජයේ දෙපාර්තමේන්තුවක් විසින් නිකුත් කරණ ලද තමාගේ ඡායාරූපය සහිත සහතිකයක් හෝ බලපත්‍රයක් තමන් හඳුනා ගැනීමට යොග්‍ය සාධක ඉදිරිපත් නොකරණු ලබන අපෙක්ෂක අපෙක්ෂිකාවන්ට පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

11. **ඇතුලත්වීමේ ගාස්තු.**—විද්‍යාලයට ඇතුලත් කරගනු සඳහා තෝරාගනු ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් ආයුර්වේද විද්‍යාල සහ ආරෝග්‍යශාලා මණ්ඩලය විසින් අනුමත කරණ ලද ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් රු. 10 ක්ද, පුස්තකාල, රසායනාගාර තැන්පත් මුදල වශයෙන් රු. 30 ක්ද ගෙවිය යුතුය.

12. **ව්‍යවස්ථා නිර්දේශ සහ පාඨමාලාව.**—නව ව්‍යවස්ථා නිර්දේශය සහ පාඨමාලාව මුද්‍රණය කරවීමට කටයුතු කරගෙනයන බැවින්, යථා කාලයේදී එය ලබාගත හැකිවේ.

13. සෑම අයදුම්කරුවකු විසින්ම තම අත්සන මෙහි පහත දක්වා ඇති නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතුය:—

(i) සමාදාන විනිශ්චයකාරවරයකු.

(ii) විදුහල්පතිවරයකු හෝ ප්‍රධානාචාර්‍යවරයකු.

(iii) වර්ෂයකට රු. 6,000 කට වැඩි ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ නිළධාරියකු.

14. **අධ්‍යයන කාලය.**—වෛද්‍ය කලානිධි ඩී.ඒ.ඇම්.ඇස්. පාඨමාලාව සඳහා අධ්‍යයන කාලය අවුරුදු 5 ක් සහ අරෝග්‍යශාලා පුහුණුව සඳහා එක් අවුරුදු කාලයක්ද ක්‍රියාත්මක වේ.

15. විද්‍යාලයට ඇතුලත් කර ගැනීමට පෙර හෝ ඇතුලත් කර ගැනීමෙන් පසු හෝ අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍රයෙහි යම් යම් අසත්‍ය කරුණු දක්වා ඇති බැව් ඒත්තු ගියහොත් ඔහු/ඇය විද්‍යාලයට බාරනොගැනීම හෝ විද්‍යාලයෙන් අස් කිරීම කරණු ලැබේ.

ඇම්. ඇස්. පී. කුරේ විද්‍යාශෙඛර,
වැ. බ. ලේඛකාධිකාරි.

1973 ජූලි මස 27 වැනි දින,
ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය,
බණ්ඩාරනායක පුර,
රාජගිරිය.

**රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ වෛද්‍ය කලානිධි ඩී.ඒ.ඇම්.ඇස්. උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා ඇතුලත්වීමේ ඉල්ලුම් පත්‍රය—1974**

(මෙම අයදුම් පත්‍රය පිරවිය යුත්තේ ගැසට් නිවේදනයේ සඳහන් කරුණු හොඳින් කියවා තේරුම් ගැනීමෙන් පසු සහ එහි දැක්වෙන කරුණු අනුව බව සලකන්න.)

1. සම්පූර්ණ නම :————.
   i. වාසගම :————.
   ii. අනිකුත් නම් :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය :————.
   (1974 ජනවාරි මස 1 දිනට වයස අවු.——මාස——දින——යි.

4. ස්ත්‍රී පුරුෂ භාවය :————.

5. ජාතිය :————.

6. පුරවැසි බව (පාරම්පරික/ලියාපදිංචිය ලත්) :————.

7. විවාහක/අවිවාහක බව :————.

8. පියා/මව/භාරකරුගේ නම :————.
   ලිපිනය :————.

9. ඉගෙනීම ලැබූ පාඨශාලාව/විද්‍යාලය :————.

10. ඇතුලත්වීමට බලාපොරොත්තු වන අංශය :————.
   (ආයුර්වේද/සිද්ධ/යුනානි)

11. ලබා තිබෙන අධ්‍යාපනික සුදුසුකම් :
   i. අ.පො.ස. (සාමාන්‍ය පෙළ)

| සමත් වර්ෂය | මාසය | විභාග අංකය | විෂය |
|---|---|---|---|
| ———— | ———— | ———— | 1. ———— |
| | | | 2. ———— |
| | | | 3. ———— |
| | | | 3. ———— |
| | | | 4. ———— |
| | | | 5. ———— |
| | | | 6. ———— |
| | | | 7. ———— |
| | | | 8. ———— |

සම්මාන ලත් විෂයයන්.

1. ———— 5. ————
2. ———— 6. ————
3. ———— 7. ————
4. ———— 8. ————

ii අ.පො.ස. (උසස් පෙළ)

| සමත් වර්ෂය | මාසය | විභාග අංකය | විෂය |
|---|---|---|---|
| ———— | ———— | ———— | ———— |
| ———— | ———— | ———— | ———— |
| ———— | ———— | ———— | ———— |
| ———— | ———— | ———— | ———— |

12. අමුනා ඇති අධ්‍යාපනික සහතික පිටපත් : 1. ————
2. ————
3. ————

13. අමුනා ඇති චරිත සහතික : 1. ————
2. ————
3. ————

14. වෙනත් කරුණු :————.

(1) වෛද්‍ය පරම්පරාව සම්බන්ධ විස්තර සනාථ කිරීම පහත දැක්විය යුතුය.————.

(2) ————

රු. 15ක වටිනාකම ඇති මුද්දර මෙහි අලවා ඒ මත අත්සන තබා අවලංගු කළ යුතුය.

————.

දිනය :————. අයදුම්කරුගේ අත්සන.

මගේ විද්‍යාලයේ ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක/කාර්යාලයේ නිලධාරියකු/මා පුද්ගලිකව හඳුනන කෙනෙකු වන ඉහත සඳහන් අයදුම්කරු අද දින මා ඉදිරිපිට දී මෙහි අත්සන් කළ බව මෙයින් සහතික කරමි.

අයදුම්කරුගේ අත්සන සහතික කරන්නාගේ අත්සන :————.

දිනය :————.

සහතික කරන අයගේ නම :————.

සහතික කළ ස්ථානය :————.

තනතුර :————.

ලිපිනය :————.

7–964—73. 07. 27 දින අංක 70 දරන ගැසට් පත්‍රය

---

අධ්‍යාපන අමාත්‍යාංශය

## ගුරුවරුන් වශයෙන් පුහුණුව සඳහා තෝරා ගැනීම—විශේෂ පාඨමාලාව, 1974

මෙම පාඨමාලා විවෘතව ඇත්තේ සේවයේ නියුක්තව සිටින ගුරුවරුන්ට පමණයි. මේවා ආයතනික පාඨමාලා වන අතර එක් එක් පාඨමාලාව දෑවුරුදු කාල පරිච්ඡේදයක් තුළ පැවැත්වේ. තම සාමාන්‍ය හැසිරීම හා ඉගෙනීමෙහි උද්යෝගීතාවය සම්බන්ධයෙන් විද්‍යාලයාධිපතිවරයා තෘප්ත කිරීමට අසමත් වන පුහුණුව ලබන්නන් පාඨමාලාව හැදෑරීමෙන් නවතා දමනු ලැබේ. මෙම කාරණය සම්බන්ධයෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්වරයා ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

පුහුණුව ලබන්නෙකුට තමා පුහුණුව ලබන කාලය තුළ වෙනත් බාහිර පාඨමාලාවක් හැදෑරීමට හෝ බාහිර විභාගයකට පෙනී සිටීමට හෝ සාමාන්‍යයෙන් ඉඩ දෙනු නො ලැබේ.

2. ඇතුළත් කිරීම.—(i) මෙම පාඨමාලාව පහත සඳහන් වර්ගවලට අයත් අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ. එබඳු අයෙකු මෙම පාඨමාලාවක් සඳහා ඇතුළත් වුවහොත් පාඨමාලාව පවත්වන කාලය ඇතුළත හෝ ඉන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ ඇතුළත්වීම අවලංගු කරනු ලැබේ :—

(අ) කවර හෝ ගුරු විද්‍යාලයක් දනටමත් පුහුණුව ලබන හෝ පුහුණුව ලබා ඇති හෝ තැපැල් මාර්ගික පාඨමාලාව හදරන අය,

(ආ) ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට පෙර 6 වැනි ඡෙදයේ සඳහන් සුදුසුකම් පිළිබඳ කොන්දේසි සියල්ලම සපුරා නොමැති අය,

(ඇ) උපාධියක් ලබා ඇති ගුරුවරුන්,

(ii) සෑම අයදුම්කරුවෙකු විසින් ම ඇතුළත් කරගනු ලැබූ දින සිට සති දෙකක් ඇතුළත, පුහුණුවේ වියදමට සමාන වටිනාකමින් ද ගුරුවරුන් සඳහා නම් නිව වූ පිට දෙවර්ෂයක වැටුප් හා සියළු ම දීමනාවලට සමාන වටිනාකමින් ද යුත් බැඳුම්කරයකට පහත සඳහන් නියමයන් ද පිළිපදින බවට පොරොන්දු වෙමින් ඇතුළත්වීම සඳහා අවශ්‍ය සියළු ම ලියකියවිලි තම ගුරු විද්‍යාලයේ විදුහල්පතිවරයා වෙත සැපයිය යුතුය :—

(අ) පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුළ දේශපාලන කටයුතුවලට සහභාගි නොවන බවට,

(ආ) කවර හේතුවක් නිසා වුවද පුහුණුවීමේ පාඨමාලාව අත් නො හරින බවට,

(ඇ) පුහුණු පාඨමාලාව නිම කිරීමේ දී අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් ඔහු/ඇය පත් කරනු ලබන පාසල්වල අවුරුදු අටක කාල පරිච්ඡේදයක් නොකඩවා සේවය කරන බවට (රජයේ නොවන පාසල්වල නියුක්ත/ගුරුවරුන් විසින් එපරිදි ම අවුරුදු 8 ක කාල පරිච්ඡේදයක් එම පාලක මණ්ඩලය හෝ රජය යටතේ ම ඇති පාසල්වල සේවය කරන බවට එම පාලක මණ්ඩලය හෝ රජය සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුය).

(ඇ) නියමිත සේවා කාල පරිච්ඡේදය සම්පූර්ණ කර බැඳුම්කරයේ නියමිත බැඳීම්වලින් සම්පූර්ණයෙන් නිදහස් වන තෙක් දෙපාර්තමේන්තුවෙන් පිටත වෙනත් තනතුරක් හෝ තවත් කාල පරිච්ඡේදයකට අධ්‍යයන නිවාඩුවක් සඳහා හෝ ඉල්ලුම් නො කරන බවට,

(iii) දිස්ත්‍රික් සේවා ක්‍රමය යටතේ පත්වීම් ලබා ඇති ගුරු පුහුණුව සඳහා ගුරු විදුහල්වලට ඇතුළත්වන අය, පුහුණුවෙන් පසු එම පත්වීම් ලත් දිස්ත්‍රික්කවලට සේවය කිරීමට යටත්වන බව සැළකිය යුතුයි.

3. වැටුප.—පාඨමාලාව සතුටුදයක ලෙස නිමකර, ගුරු පත්වීම් ලබන පුහුණුවන්නවුන්ට අළුත් පත්වීම ලබන දිනට අදළ වැටුප් ක්‍රමය මත වැටුප් ගෙවනු ලැබේ.

4. සිංහල/දෙමළ මාධ්‍යයෙන් පැවැත්වෙන පාඨමාලාවක් හැදෑරීම සඳහා ඇතුළත්වීමට සිංහල/දෙමළ සහිතව ජ්‍යෙ. පා. ස. හෝ අ. පො. ස. (සා.පෙ.) සාමාර්ථය ලබා නොමැති කිසිම අපේක්ෂකයෙකු සුදුස්සකු නොවනු ඇත.

5. පහත සඳහන් විශේෂ විෂය ප්‍රසරයන් සම්බන්ධයෙන් පුහුණුව ලබත හැක :—

(1) ඉංග්‍රීසි
(2) ගණිතය
(3) විද්‍යාව
(4) හස්ත කර්මාන්තය
(5) වාණිජ විද්‍යාව
(6) ගෘහ විද්‍යාව
(7) ශාරීරික අධ්‍යාපනය
(8) කෘෂිකර්මය
(9) ලලිත කලා

6. සුදුසුකම්—'ඒ' සාමාන්‍ය.—සෑම අයදුම්කරුවෙකු ම—

(i) යහපත් චරිතයෙන් යුක්ත විය යුතුය.

(ii) ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(iii) 1974.1.1 වැනි දිනට වයස අවුරුදු 45 ට අඩු විය යුතුය.

(iv) 1972.12.31 දිනට පෙර ගුරුවරයෙකු වශයෙන් පත්වීමක් ලබා සිටිය යුතුය.

(v) 4 වැනි රෙගුලාසියේ සඳහන් සිංහල/දෙමළ භාෂා අවශ්‍යතාවය සපුරාලිය යුතුය.

(vi) සිංහල/දෙමළ භාෂාව හා අංක ගණිතය/වාණිජ අංක ගණිතය/ගණිතය සහිත ව අවස්ථා දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 6 කින් අ.පො.ස. (සා.පෙ.)/ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සාමාර්ථය ලබා තිබිය යුතුය.

(vii) එක් එක් විෂය ප්‍රසරයන් සඳහා ඉල්ලුම් කරන ගුරුවරුන් එම විෂයයට අදාළ ගුරු පත්වීමක් හෝ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ උපදේශක/පරීක්ෂක තනතුරක් ලබා තිබිය යුතුය. (උදාහරණයක් වශයෙන් ඉංග්‍රීසි පාඨමාලාව සඳහා අයදුම්කරුට ඉංග්‍රීසි ගුරුවරයකු වශයෙන් පත්වීමක් ලබා තිබිය යුතුයි). පත්වීමේ ලිපියේ විෂය සඳහන් නො කර ඇත්නම් එම විෂය යටත් පිරිසෙයින් සතියකට පැය 15 කට නො අඩු කාලයක් උගන්වන බවට සාධක සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

සටහන.—1952 දෙසැම්බර් මස අ.පො.ස. (සා.පෙ.) විෂය විභාගය ආරම්භ කිරීමට පෙර ජ්‍යෙ.පා.ස. විභාගයේ දී තනි විෂයයන්ගෙන් ලබාගත් සාමාර්ථයක් ගණන් ගනු නො ලැබේ.

'බී' විශේෂ.—සෑම අයදුම්කරුවෙකුට ම—

(අ) ඉංග්‍රීසි පාඨමාලාව සඳහා පහත සඳහන් සුදුසුකම්වලින් එකක් තිබිය යුතුය :—

(i) 1 වැනි පෙළ, 2 වැනි පෙළ හෝ 3 වැනි පෙළ ඉංග්‍රීසි ගුරු සහතික පත්‍රය.

(ii) 1966.12.31 දිනට ප්‍රථම ඉංග්‍රීසි ගුරුවරයෙකු වශයෙන් පත්වීමක් ලබා තිබීම. ඉංග්‍රීසි පාඨමාලාව සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන්ගෙන් තෝරා ගන්නා අය 1974 පෙබරවාරි මස සම්මුඛ පරීක්ෂණයට කැඳවා එම වර්ෂයේ දී ඉංග්‍රීසි භාෂාව පිළිබඳ තැපැල් පුහුණුවක් ලබා දී 1975 වර්ෂයට පුහුණුව පිණිස ගුරු විද්‍යාලවලට ඇතුළත් කරනු ඇත. ඒ අනුව, මෙම පාඨමාලාව සඳහා 1975 ජනවාරි මස 1 වන දිනට වයස අවුරුදු 45 ට අඩු වන අය පමණක් බඳවා ගනු ලැබේ.

(ආ) ගණිත පාඨමාලාව සඳහා මින් එකක්—

(i) ජ්‍යෙ.පා.ස. හෝ අ.පො.ස. (සා.පෙ.) විභාගයේදී, ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය, උසස් ගණිතය යන විෂයයන්ගෙන් දෙකක්.

(ii) ජ්‍යෙ.පා.ස. හෝ අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී භෞතික විද්‍යාවෙන් හෝ රසායනික විද්‍යාවෙන් සාමාර්ථයක් සහිත ව ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය, උසස් ගණිතය යන විෂයයන් එකකින් සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

(iii) අ.පො.ස. (උ.පෙ.) විභාගයේ දී ශුද්ධ ගණිතයෙන් හෝ ව්‍යවහාරික ගණිතයෙන් සාමාර්ථයක් ලබා තිබීම.

(ඇ) විද්‍යා පාඨමාලාව සඳහා මින් එකක්—

(i) ජ්‍යෙ.පා.ස. හෝ අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී ගණිතය හා භෞතික විද්‍යාවත් සමග පහත සඳහන් විෂයයන් අතුරින් දෙකක්—

රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ව විද්‍යාව, ජීව විද්‍යාව, උද්භිද විද්‍යාව හෝ සත්ව විද්‍යාව සමග ජීව විද්‍යාව ගණන් ගනු නො ලැබේ. මෙම විෂයයන් හතරින් යටත් පිරිසෙයින් දෙකක්වත් සම්මාන සාමාර්ථ මට්ටමින් විය යුතුයි.

(ii) අ.පො.ස. (සා.පෙ.)/ජ්‍යෙ.පා.ස. විභාගයේ දී ගණිතය විෂයයෙන් සාමාර්ථයක් සහිතව අ.පො.ස. (උ.පෙ.) විභාගයේ දී භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව යන විෂයයන් එකකින් සාමාර්ථය ලබා තිබීම.

(ඈ) හස්ත කර්මාන්ත පාඨමාලාව සඳහා මින් එකක්—

(i) පුරුෂ පක්ෂයට—ජ්‍යෙ.පා.ස. හෝ අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී පහත සඳහන් විෂයයන් අතරින් දෙකක් :—

(1) ලී වැඩ සඳහා සාමාර්ථයක්.

(2) ලෝහ වැඩ සඳහා සාමාර්ථයක්

(3) ජ්‍යාමිතික ඇඳීම සඳහා සාමාර්ථයක්.

(4) භෞතික විද්‍යාව සඳහා සාමාර්ථයක්.

(ii) ස්ත්‍රී පක්ෂයට—ජ්‍යෙ.පා.ස. හෝ අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී පහත සඳහන් විෂයයන් අතරින් දෙකක් :—

(1) රෙදි විවීම සඳහා සාමාර්ථයක්.

(2) මැටි ශිල්පය සඳහා සාමාර්ථයක්.

(3) චිත්‍ර කර්මය සඳහා සාමාර්ථයක් හෝ ජ්‍යාමිතික ඇඳීම සඳහා සාමාර්ථයක්.

(4) රසායන විද්‍යාව සඳහා සාමාර්ථයක්.

**සටහන i.**—අධ්‍යයන පොදු (සා.පෙ.) සහතික පත්‍රයක හෝ පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍රයක අදළ කර්මාන්තය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් වෙනුවට ලංකා කාර්මික විද්‍යාලයේ කර්මාන්ත ගුරු සහතික පත්‍රය හෝ අවශ්‍ය කර්මාන්තවලින් එකක් පිළිබඳව අවුරුදු තුනක පාඨමාලාවක් සාර්ථක ලෙය සම්පූර්ණ කිරීමෙන් පසුව රජයේ ලලිත කලායතනය විසින් ප්‍රදනය කරනු ලබන සහතික පත්‍රය හෝ ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ විවිධ පිළිබඳ අවසාන සහතිකය පිළිගනු ලැබේ. එහෙත්, මෙම සහතික පත්‍ර ඉහත 6(vi) වැනි ඡෙදයේ දක්වා ඇති සාමාන්‍ය අවශ්‍යතාවයන් වන විෂයයන් හය හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා හෝ පිළිගනු නො ලැබේ.

**සටහන ii.**—අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් ලංකා කාර්මික විද්‍යාලය හෝ කණිෂ්ඨ කාර්මික විද්‍යාල මගින් නිකුත් කරන ලද වෘත්තීය සහතික පත්‍රය දරන්නන්, එම සහතික පත්‍රයේ ජ්‍යාමිතික හා යාන්ත්‍රික ඇඳීම, ලී වැඩ, හෝ ලෝහ වැඩ, රෙදි විවීම හෝ මැටි ශිල්පය ඇතුළත් ව තිබේ නම් ඉහත දී ඇති ව්‍යවස්ථාවල අවශ්‍යතාවක් වන එම විෂයයන්ගෙන් නිදහස් කරනු ලැබේ.

(ඉ) වාණිජ විද්‍යා පාඨමාලාව සඳහා මින් එකක්—

(i) ලන්ඩන් වාණිජ මණ්ඩල සහතික පත්‍රය (උසස් හෝ පහළ)

(ii) ලංකා කාර්මික විද්‍යාලයේ පොත් තබන්නන් සඳහා වූ වාණිජ සහතික පත්‍රය (උසස් හෝ පහළ)

(iii) ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පොත් තබන්නන් සඳහා වූ වාණිජ සහතික පත්‍රය.

(iv) අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී ගණකාධිකරණය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ අ.පො.ස. (උ.පෙ.)/උ.පා.ස. විභාගයේ දී ගණකාධිකරණය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් සහිත ව ලන්ඩන් වාණිජ මණ්ඩලයේ ලඝු ලේඛක යතුරු ලියන්නන් සඳහා වූ (උසස් හෝ පහළ) සහතික පත්‍රය.

(v) අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී ගණකාධිකරණය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ අ.පො.ස. (උ.පෙ.)/උ.පා.ස. පරීක්ෂණයේ දී ගණකාධිකරණය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් සහිත ව ලංකා කාර්මික විද්‍යාලයේ ලඝු ලේඛක යතුරු ලියන්නන් සඳහා වූ (උසස් හෝ පහළ) වාණිජ සහතික පත්‍රය.

(vi) අ.පො.ස. (සා.පෙ.) පරීක්ෂණයේ දී ගණකාධිකරණය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ අ.පො ස. (උ.පෙ.)/උ.ප.ස. පරීක්ෂණයේ දි ගණකාධිකරණය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් සහිත ව ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ලඝු ලේඛක යතුරු ලියන්නන් සඳහා වූ වාණිජ සහතික පත්‍රය.

(vii) ලංකා කාර්මික විද්‍යාලයේ වාණිජ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ දෙවැනි වසරෙහි පැවැත්වෙන පරීක්ෂණයේ දී ලබා ගන්නා ලද සාමාර්ථයක්.

(viii) කණිෂ්ඨ විශ්ව විද්‍යාලයක වාණිජ්‍ය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය.

(ix) අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දි වාණිජ අංක ගණිතය, අර්ථ ශාස්ත්‍රය, ලඝු ලේඛනය හා යතුරු ලියනය, ගණිතය යන විෂයයන් ගෙන් එකක් සහිත ව අ.පො.ස. (උ.පෙ.)/උ.පා.ස. පරීක්ෂණයේ දී (අ) ගණකාධිකරණය (ආ) වාණිජ්‍ය හා මුදල් යන විෂයයන් ගෙන් සාමාන්‍ය සාමාර්ථයක්.

(x) වාණිජ්‍ය, වාණිජ අංක ගණිතය, අර්ථ ශාස්ත්‍රය, ලඝු ලේඛනය හා යතුරු ලියනය යන විෂයයන් අතරින් එකක් හා ගණකාධිකරණය ද සහිත සිංහල ගුරු සහතික පත්‍රය.

(xi) ජ්‍යෙ.පා.ස. හෝ අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී ගණකාධිකරණය ඇතුළු ව පහත සඳහන් විෂයයන් අතරින් සාමාර්ථ දෙකක් :—

වාණිජ අංක ගණිතය, ගණිතය, වාණිජ විද්‍යා මූලධර්ම, ආර්ථික විද්‍යාව, ලඝු ලේඛනය හා යතුරු ලියනය. 1962 වර්ෂයේදී හෝ ඊට පෙර සමත්වූ අය හැර, සෙසු අයට ලඝු ලේඛණය හා යතුරු ලියනය එක් විෂයයක් ලෙස ගණන් ගනු ලැබේ.

(ඊ) ගෘහ විද්‍යා පාඨමාලාව සඳහා මින් එකක්—

(i) අ.පො.ස. (සා.පෙ.) හෝ ජ්‍යෙ. පා. ස. විභාගයේ දී,

(අ) පහත සඳහන් විෂයයන්ගෙන් දෙකකට සාමාර්ථයන් ලබා තිබිය යුතු අතර, ඉන් එක විෂයයක් සම්මාන මට්ටමේ විය යුතුය:—

ගෘහ විද්‍යාව, ගෘහකර්මාන්තය, මැහුම් වැඩ

(ආ) පහත සඳහන් විෂයයන් අතරින් යටත් පිරිසෙයින් එකක් :—

ස්වස්ථතාව හා ශාරීරික විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව.

(ii) අවුරුදු දෙකක පාඨමාලාවක අවසානයේ දී ලබාගත් කුණ්ඩසාලේ කාන්තා ගොවි පාසලේ කෘෂිකර්මය පිළිබඳ සහතික පත්‍රය. (ගෘහ විද්‍යාව හා මැහුම් වැඩ ඇතුළු ව)

(iii) අවුරුදු දෙකක පාඨමාලාවක අවසානයේ දී ලබාගත් කුණ්ඩසාලේ කාන්තා ගොවි පාසලේ ග්‍රාමීය ගෘහ පාලනය පිළිබඳ සහතිකය

(උ) ශාරීරික අධ්‍යාපන පාඨමාලාව සඳහා මින් එකක්—

(i) අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී—

(අ) ස්වස්ථතාව හා ශාරීරික විද්‍යාව හෝ සෞඛ්‍ය විද්‍යාව යන විෂයයන්ගෙන් සම්මාන සාමාර්ථයක්.

(ආ) භෞතික විද්‍යාව, රසායන විද්‍යාව හෝ ජීව විද්‍යාවෙන් සාමාන්‍ය සාමාර්ථයක් (ජීව විද්‍යාව වෙනුවට උද්භිද විද්‍යාවත් සමග සත්ව විද්‍යාව ගණන් ගත හැකි වේ.)

(ii) ගුරුවරුන් සඳහා වූ ශාරීරික අධ්‍යාපන පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කලායින් පසු මදුරාසියේ සයිඩපෙට් හි තරුණ ක්‍රිස්තියානි සමිති විද්‍යාලය මගින් නිකුත් කරනු ලබන ගුරු සහතික පත්‍රයක්. සෑම අයදුම්කරුවෙක් ම සම්මුඛ පරීක්ෂණයේ දී ඔහු/ඇය ක්‍රීඩා/මලල ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශිෂ්ඨ සාමාර්ථ ලබා ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ.

(ඌ) කෘෂිකර්ම පාඨමාලාව සඳහා මින් එකක්—

(i) සහතික නොලත් කෘෂිකර්ම ගුරුවරුන් සම්බන්ධයෙන් ජ්‍යෙ.පා.ස. හෝ අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී කෘෂිකර්මය, රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ව විද්‍යාව, ජීව විද්‍යාව යන විෂයයන් අතරින් එකකින් සාමාර්ථයක්.

(ii) කෘෂිකර්මය සම්බන්ධයෙන් රජයේ ගොවි පාසලක මාස හයකට නො අඩු කාලයක පුහුණුවක්.

(එ) ලලිත කලා පාඨමාලාව.—මෙම පාඨමාලාවට කොටස් තුනක් ඇතුළත් වේ. චිත්‍රකර්මය, සංගීතය, නැටුම්.

(අ) චිත්‍රකර්ම පාඨමාලාව සඳහා අපේක්ෂකයෙකුට මින් එකක් තිබිය යුතුයි—

(i) රජයේ ලලිත කලායතනයේ සහතික පත්‍රය (චිත්‍රකර්මය පිළිබඳ 3 න් අවුරුදු පාඨමාලාව).

(ii) සිංහල/දෙමළ/ඉංග්‍රීසි චිත්‍රකර්ම ගුරු සහතික පත්‍රය.

(ආ) සංගීත පාඨමාලාව සඳහා අපේක්ෂකයෙකුට මින් එකක් තිබිය යුතුයි—

(i) ලංකා ගාන්දර්ව සභාවේ සංගීතය පිළිබඳ අවසාන සහතික පත්‍රය/සංගීතය පිළිබඳ රජයේ පරීක්ෂණයේ අවසාන සහතික පත්‍රය.

(ii) රජයේ සංගීත විද්‍යාලයේ අන්තර් මධ්‍ය සහතික පත්‍රය.

(iii) උත්තර ලංකා පෙරදිග සංගීත ගුරුවරුන්ගේ සංගමයේ සංගීතය පිළිබඳ සහතික පත්‍රය (5 වැනි ශ්‍රේණිය),

(iv) පිළිගත් ඉන්දීය සංගීත ආයතනයක සංගීතය පිළිබඳ අන්තර් මධ්‍ය සහතික පත්‍රය.

(ඇ) නැටුම් පිළිබඳ පාඨමාලාව සඳහා අපේක්ෂකයෙකුට මින් එකක් තිබිය යුතුයි—

(i) ලංකා ගාන්ධර්ව සභාවේ නැටුම් පිළිබඳ අවසාන සහතික පත්‍රය/නැටුම් පිළිබඳ රජයේ පරීක්ෂණයේ අවසාන සහතික පත්‍රය.

(ii) රජයේ නැටුම් විද්‍යාලයේ අන්තර් මධ්‍ය සහතික පත්‍රය.

(iii) පිළිගත් ඉන්දීය නැටුම් ආයතනයක අන්තර් මධ්‍ය සහතික පත්‍රය.

7. 6 (iv) ඡේදයේ කාර්යයන් සඳහා අයදුම් පත් භාර ගන්නා අවසාන දින රජයේ හෝ අධ්‍යක්ෂ පාලිත පාසලක යෝග්‍ය ගුරු මණ්ඩලයක සේවය කරන ගුරුවරුන් 6 (iv) ඡේදයේ කාර්යයන් සඳහා ගුරුවරුන් වශයෙන් සළකනු ලැබේ. පිළිගත් පෞද්ගලික පාලක ස්ථිර ගුරු මණ්ඩලයේ නියුක්ත සාමාන්‍ය පන්තිවල සතියකට පැය 20 ක් ඉගැන්වීම කරන ගුරුවරුන් ද මෙම කාර්යය සඳහා ගුරුවරුන් වශයෙන් සළකනු ලැබේ. මේ සඳහා පහත දක්වෙන පාසල් පෞද්ගලික පාසල් වශයෙන් සළකනු ලැබේ :—

(i) 1951 වර්ෂයේ දී ගාස්තු අය කිරීමේ පාසල් බවට පත් වූ උපකෘත පාසල්.

(ii) 1960.12.1 වැනි දින, ගාස්තු අය නො කරන පෞද්ගලික පාසල් බවට පත් වූ I වැනි හා II වැනි ශ්‍රේණිවල පාසල්.

(iii) දැනට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත කර ඇති පෞද්ගලික පාසල් සහ පිරිවෙන්. ( (iii) යටතේ සඳහන් කර ඇති පෞද්ගලික පාසල් සහ පිරිවෙන් ගුරුවරුනට යටත්පිරිසෙයින් අවුරුදු 5ක අඛණ්ඩ සේවයක් තිබිය යුතුය).

මෙකී වර්ගවලට අයත් ගුරුවරුන්ට, සිය පුහුණුවීමේ කාල පරිච්ඡේදය තුළ දී පාලක මණ්ඩලය මගින් වැටුප් හෝ දීමනාවක් ගෙවන බවට හා පුහුණුවෙන් පසු එම පාලක මණ්ඩලය යටතේ ම නැවත රැකියාවෙහි යොදන බවට සම්මුඛ පරීක්ෂණයේ දී එම ගුරුවරුන් විසින් ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. මෙම අය ගුරු පුහුණුවෙන් පසු රජය යටතේ පත්වීම් අපේක්ෂා නොකළ යුතුයි.

8. **(i) තෝරා ගැනීම සඳහා ඉල්ලුම් කිරීම**—මෙම ගැසට් නිවේදනයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව අපේක්ෂකයා විසින් පිළියෙල කරගනු ලබන අයදුම් පතක් සම්පූර්ණ කොට එමගින් ඉල්ලුම් කළ යුතුය.

අයදුම්කරුවන් විසින් පුහුණු පාඨමාලාව හැදෑරීමට අපේක්ෂා කරන මාධ්‍යයෙන් ම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ යුතුයි. මේ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් මුද්‍රිත පෝරම නිකුත් කරනු නො ලැබේ. ඉල්ලුම් පත්‍රය පිළියෙල කිරීමේ දී පහත සඳහන් නියමයන් තරයේ පිළිපැදිය යුතුය. මින් කවර හෝ නියමයක් නොසළකා හැරීම ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වනු ඇත :—

(අ) ආකෘති පත්‍රය දළ වශයෙන් 16″ × 12″ ෆුල්ස් කැප් කඩදසියක මිස වෙනත් කවර කඩදසියක පිළියෙල නො කළ යුතුය.

(ආ) ආකෘති පත්‍ර යතුරු ලිවීමෙන් පිළියෙල කර ගත හැකිය. එය අතින් පිළියෙල කරන්නේ නම් එහි රූල් ගැසිය යුත්තේ රතු තීන්තෙනි. කොටු පිරවීම කළයුතු වන්නේ නිල් හෝ කළු තීන්තෙනි.

(ඇ) කිසිම කොටුවක වෙනස් කිරීම හෝ ඉවත් කිරීම නොකළ යුතුය. කොටු අතර ඉඩ ප්‍රමාණය සැළකිල්ලෙන් වෙන් කළ යුතු අතර, කොටු එකිනෙකට හොඩ ගැසෙන සේ පිළියෙල නොකළ යුතුය.

(ඈ) ඉල්ලුම් පත්‍රයේ 6 වැනි කොටුවෙහි පුහුණුවීමේ පාඨමාලාවට සම්බන්ධ විෂයයන් යනුවෙන් අදහස් කරනු ලබන්නේ අපේක්ෂකයෙකු අ.පො.ස. (සා.පෙ.) හා අ.පො.ස. (උ.පෙ.) විභාගවලින් සමත් වූ විෂයයන් අතුරෙන් ඉහත ''6බී'' ඡේදයෙහි දක්වා ඇති පරිදි මෙම පාඨමාලාව සඳහා සුදුස්සෙකු වීමට ඔහු විසින් සමත් ව තිබිය යුතු විෂයයන් ය. නිදසුනක් වශයෙන් ගණිත පාඨමාලාව සඳහා පහත සඳහන් විෂයයන් ගෙන් ඔහු ලබා ඇති මට්ටමය :—

ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය, උසස් ගණිතය, භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව.

(ඉ) ඉහත දක්වෙන 6 බී ඡේදයේ සඳහන් ප්‍රකාර කවර හෝ පාඨමාලාවක් සඳහා වර්ග කීපයක් අතුරෙන් වර්ගයක් යටතේ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුතුය. නිදසුනක් වශයෙන් ඉංග්‍රීසි පාඨමාලාව සඳහා වර්ග දෙකක් ද වාණිජ පාඨමාලාව සඳහා වර්ග එකොළහක් ද ඇතුළත් ය. ඉල්ලුම් පත්‍රයේ 9 වැනි කොටුවෙහි ඔබට ඉල්ලීමට සුදුසුකම් ඇති පාඨමාලාව හා වර්ගය සඳහන් කරන්න. ඔබගේ සුදුසුකම් අනුව ඔබගේ ඉල්ලුම් පත්‍රය එක් පාඨමාලාවක වර්ග කීපයකට වැටේ නම් මෙතැන දී වර්ග කීපය ම සඳහන් කිරීම අවශ්‍ය ය. මෙම වර්ග හෝ වර්ග හැඳින්වීම (i), (ii), (iii) යනාදී වශයෙන් ඉහත 6බී ඡේදයේ යොදා ඇති අංකයෙන් ම විය යුතුය.

(ඊ) අපේක්ෂකයෙකුට එක් පාඨමාලාවකට වැඩියෙන් ඉල්ලුම් කිරීමට සුදුසුකම් තිබේ නම්, එසේ ඉල්ලුම් කරන එක් එක් පාඨමාලාව සඳහා වෙන වෙන ම ඉල්ලුම් පත්‍රය බැගින් එවිය යුතුය. එක් ඉල්ලුම් පත්‍රයක් එක් පාඨමාලාවක් සඳහා පමණක් ඉල්ලුම් කිරීමට පාවිච්චි කළ යුතුය.

(ii) අයදුම්කරු විසින් ඉල්ලුම් පත්‍රය නො අඩු ව හා නිවැරදි ව පිරවිය යුතුය. අසම්පූර්ණ ඉල්ලුම් පත්‍රයක් එහි අන්තර්ගත විස්තර අනුව තීරණය කරන අතර ප්‍රතික්ෂේප කිරීමට ද ඉඩ තිබේ. පහත සඳහන් කරුණු කෙරෙහි අයදුම්කරුවන් ගේ අවධානය යොමු කරනු ලැබේ :—

(අ) ගුරුවරයෙකු විසින් තම නම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇති පරිදි ම සඳහන් කළ යුතුය.

(ආ) සෑම ගුරුවරයෙකු විසින් ම ඔහු/ඇය දැනට දරන පත්වීම 6 (vi) හි විස්තර කර ඇති පරිදි ඉල්ලුම් පත්‍රයේ 9 වෙනි කොටුවේ සඳහන් කළ යුතුය. පත්වීමේ දිනය සහ ගුරුවරයෙකු වශයෙන් ලියාපදිංචි කිරීමේ අංකය 2 වන කොටුවේ සඳහන් කළ යුතුය.

(ඇ) අයදුම්කරු ඉගැන්වීම කරන පාසලේ ප්‍රධානියා මගින් ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

(ඈ) සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය කවරයක බහා කවරයේ වම් පැත්තේ ඉල්ලුම් කරන ලද පාඨමාලාව පිළිබඳ ව පහත දක්වෙන තොරතුරු පැහැදිලි ව සඳහන් කළ යුතුය:—

..........................විශේෂ පාඨමාලාව සඳහා ඉල්ලුම් පත්‍රය.

(ඉ) ඉල්ලුම් පත්‍රය 1973 අගෝස්තු 20 දිනට හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ, ගුරු අධ්‍යාපන ශාඛාවේ, අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(iii) ඉල්ලුම් පත්‍රය ලැබුන බව දන්වනු නො ලැබේ.

(iv) ඉල්ලුම් පත්‍රයට ලියකියවිලි අමුණා නො එවිය යුතුය.

1973 ජූලි 13 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

පී. උඩගම,
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

ආදර්ශ ඉල්ලුම් පත්‍රය

1974 වර්ෂයේ දී ගුරුවරුන් වශයෙන් පුහුණු කිරීම සඳහා තෝරා ගැනීමේ ඉල්ලුම් පත්‍රය

විශේෂ පාඨමාලාව

| |
|---|
| මාධ්‍යය : |
| සිංහල/දෙමළ : |
| පිරිමි/ගැහැණු : |

1. ඉල්ලුම් කරන විශේෂඥ විෂය (අදාළ කොටුව කතිරයකින් ලකුණු කරන්න. මෙම අයදුම් පත් පෝරමයේ එක කොටුවක් පමණක් ලකුණු කරන්න) :

| ඉංග්‍රීසි | ගණිතය | විද්‍යාව | හස්ත කර්මාන්ත | වාණිජ | ගෘහ විද්‍යාව | කෘෂිකර්මය | ශාරීරික අධ්‍යාපනය | චිත්‍ර | ලලිත කලා සංගීත | නැටුම් |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ☐ | ☐ | ☐ | ☐ | ☐ | ☐ | ☐ | ☐ | ☐ | ☐ | ☐ |

2. (i) සම්පූර්ණ නම (පෙළපත් නාමය මුලට) :———— පත්වීමේ දිනය :———— ලියාපදිංචි කිරීමේ අංකය :————

(ii) භාවිතා කරන අයුරු මුලකුරු සමග නම :————

3. ලිපිනය : පාසලේ ලිපිනය :———— ගෙදර ලිපිනය :————

වර්ගය : රජයේ/ගාස්තු අය කරන පුද්ගලික/ගාස්තු අය නොකරන පෞද්ගලික/අනුමත පුද්ගලික/පිරිවෙන්. දිස්ත්‍රික්කය :————

දිස්ත්‍රික්කය :———— ඡන්ද කොට්ඨාශය :————

ඡන්ද කොට්ඨාශය :————

4. උත්පත්තිය :— 1974.1.1 දිනට වයස : අ.——මා.——දි.——

උපන් දිනය :———— ඔබගේ වයස පෙන්නුම් කරන කොටුව ලකුණු කරන්න.

උපන් දිස්ත්‍රික්කය :————

ඡන්ද කොට්ඨාශය :————

| 18–23 | 23–28 | 28–32 | 30–40 | 40–45 |
|---|---|---|---|---|
| ☐ | ☐ | ☐ | ☐ | ☐ |

| 5. සමත් වූ උසස්ම විභාගයේ විස්තර හෝ වෘත්තීය සුදුසුකම් | විභාගයේ නම | සහතිකයේ අංකය | දිනය | සමත් වූ විෂයයන් |
|---|---|---|---|---|
| | | | | |

| 6. අ.පො.ස. විභාගයේ ප්‍රතිඵල | විභාගය | වර්ෂය හා | පුහුණුවීමේ පාඨමාලාවට සම්බන්ධ විෂයය | වෙනත් විෂයයන් |
|---|---|---|---|---|
| එක් එක් විෂයය සඳහා ලබා ඇති ශ්‍රේණිය මේ අන්දමට ලකුණු කළ යුතුය. | අ.පො.ස. (සා.පෙ.) | | | |
| සාමාර්ථ්‍ය—සා. සම්මාන—සම්. විශිෂ්ට—වි. | අ.පො.ස. (උ.පෙ.) | | | |

7. සේවා විස්තර :

| පාසලේ නම | ලිපිනය | දිස්ත්‍රික්කය | පත්වීමේ දිනය | ස්ථාන මාරුවීමේ අංකය |
|---|---|---|---|---|
| | | | | |

8. බාහිර ක්‍රියාකාරකම් :

(අ) ක්‍රීඩා :————

(ආ) සමිති :————

(ඉ) සමාජ වැඩ :————

9. ඉල්ලුම්කරුගේ ප්‍රකාශය :—

මගේ පත්වීම............ගුරුවරයෙකු වශයෙනි. මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් කර ඇති ප්‍රකාශයන් නිවැරදි බවට සහතික කරන අතර ඒවා ඉල්ලු විටක, ලියකියවිලි මගින් ඔප්පු කිරීමට මම පොරොන්දු වෙමි. මා............පාඨමාලාව සඳහා ඉල්ලුම් කර ඇත්තේ............වර්ගය යටතේ ය.

දිනය :————

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

10. පාසල් ප්‍රධානියාගේ/මා.අ.නි. ගේ සහතිකය :

ඉහත නම සඳහන් ඉල්ලුම්කරු :

(i) මගේ පාසලේ/මණ්ඩලයේ උපගුරුවරයෙකු/මුල්ගුරුවරයෙකු බව,

(ii) ———— දින සිට———— දක්වා ඔහුගේ/ඇගේ වැඩ සතුටුදායක බව,

(iii) සහතික ලත්/සහතික නොලත් ගුරුවරයෙකු බව,

(iv) ඔහුගේ/ඇගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බව, මෙයින් සහතික කරමි.

දිනය :————

————————,
පාසල් ප්‍රධානියා ගේ/මා.අ.නි. ගේ අත්සන.

නම හා තරාතිරම :————

රාජකාරි ලිපිනය :————

අනවශ්‍ය වචන කපා හරින්න.

7-1005—73.07.27 දින අංක 70 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

1973

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|
| ජූලි | 73.07.06 | සිකුරාද | ... | 73.06.27 | බදාදා | දවල් | 12.00 |
| | 73.07.13 | සිකුරාද | ... | 73.07.04 | බදාදා | දවල් | 12.00 |
| | 73.07.20 | සිකුරාද | ... | 73.07.11 | බදාදා | දවල් | 12.00 |
| | 73.07.27 | සිකුරාද | ... | 73.07.18 | බදාදා | දවල් | 12.00 |
| අගෝස්තු | 73.08.03 | සිකුරාද | ... | 73.07.25 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.10 | සිකුරාද | ... | 73.08.01 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.17 | සිකුරාද | ... | 73.08.08 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.24 | සිකුරාද | ... | 73.08.15 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.31 | සිකුරාද | ... | 73.08.22 | බදාදා | දවල් | 12.00 |
| සැප්තැම්බර් | 73.09.07 | සිකුරාද | ... | 73.08.29 | බදාදා | දවල් | 12.00 |
| | 73.09.14 | සිකුරාද | ... | 73.09.05 | බදාදා | දවල් | 12.00 |
| | 73.09.21 | සිකුරාද | ... | 73.09.11 | බදාදා | දවල් | 12.00 |
| | 73.09.28 | සිකුරාද | ... | 73.09.19 | බදාදා | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. සිරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.